Parliamentary Research Journal

*People and Environment*

Editor in Chief:

**Neil Iddawala**

*Deputy Secretary General of Parliament*

Editorial Board:

**G. Kumanayake**
**Mohammed Ajiwadeen**
**Ayesha Godagama**
**Maduri Dissanayake**
**Erandathi Lokuge**
**Anjana Abeykoon**
**Harshani Wijayathilaka**
**Subhashini Amugoda Arachchi**
**V. Muralithas**

**Parliament of Sri Lanka**
Sri Jayawardenepura
Kotte, Sri Lanka.

*Email:*
**journal@parliament.lk**

*Web:*
**www.parliament.lk**

**2013**

Volume : I
Number : 03

ISSN 2235 - 9036

# Contents

*Contents* ........................................................................................ *i*
*Editorial Note* ................................................................................ *ii*

**ගෝලීය පරිසරය අර්බුදයට එකම විසඳුම කාල් මාක්ස්ගේ පරිසර දර්ශනයයි**
**Karl Marx's Eco-Philosophy is the Only Solution to the Environmental Crisis .......... 01**
*- හිටපු මහාචාර්ය ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි*

**Waste Management in Sri Lanka: Effective Approaches ............... 21**
*- G. Kumanayake*

**Livelihood Diversification in System H of Accelerated Mahaweli Development Project: Solution towards Sustainable Livelihood...33**
*- Dr. Fazeeha Azmi*

**Climate Change and Human Security ................................46**
*- J. Subhashini Amugoda Arachchi*

**Reducing Man's Footprint on Earth................................ .......59**
*- Dr. (Mrs) Ajantha Perera*

**Environmental Impacts and Modern Agriculture ......................67**
*- V. Muralithas*

# Editorial Note

*The Research Division of the Parliament of Sri Lanka commenced publishing an annual research journal in 2011. It seeks to focus on many vital issues pertaining to legislation and policy formulation. As the representative body of the people, Parliament is entrusted with enacting legislation for the benefit of the country. Therefore, parliamentarians should have awareness on key issues that affect society. However, this Journal would be useful to all those who are interested in socio-economic issues.*

*The theme of the third issue of the Journal is 'People and Environment'. The concept 'people and the environment' has a long history. Their interdependence is a well accepted fact. However, the destruction of the environment is a grave problem which requires the attention of all stakeholders such as lawmakers, local government institutions, bureaucrats, industrialists, farmers and the general public. Although there should be harmonious relationship, sadly the environment faces regular onslaughts. Due to irresponsible human conduct and behaviour the environment is destroyed in almost all parts of the planet. Regrettably all governments and parliaments fail to take effective action to safeguard the environment. In order to achieve short-term economic benefits, the grave damage caused by environmental degradation and pollution is ignored.*

*One of our contributors examines global climate change and its impact on people. Some of these impacts such as cyclones and heat waves could be life threatening. It is obvious that we need to take action to reduce the greenhouse gas emissions that are causing climate change.*

*The garbage problem which is described as a 'silent problem' too is discussed. In Sri Lanka this issue has been largely mishandled and the writer of this essay cites examples from some countries which have successfully addressed the issue.*

*The close links that exist between agriculture and the environment are examined and the importance of engaging in agriculture while protecting the environment is highlighted in another paper in the Journal.*

*In the mid 19th century, Karl Marx predicted the present environmental crisis which is directly linked to capitalism. The capitalist system is responsible for the present chaotic situation and it is unjustifiable to accuse 'man'. The writer of this essay argues that the solutions could be found only through a socialist programme based on Marxist theory.*

*Another article deals with the issue of 'development' and its relationship with the environment. The architects should design eco-friendly buildings. The writer states that instead of fuel and electricity, sunlight could be used to get natural light. By preserving the forest cover, effects of landslides could be mitigated. The importance of buffer zones in protecting human life and water bodies is emphasized.*

*We anticipate that our readers would find these articles interesting, stimulating and thought provoking. Your comments, suggestions or dissenting views are most welcome.*

*December, 2013* *Editor*

**The views expressed in the journal are the contributors' own and do not necessarily represent the opinions of the editorial board.**

# ගෝලීය පරිසරය අර්බුදයට එකම විසඳුම කාල් මාක්ස්ගේ පරිසර දර්ශනයයි
# Karl Marx's Eco-Philosophy is the Only Solution to the Environmental Crisis

**_Prof. Desmond Malllikarachchi_**

*He obtained his BA (Hons) (Philosophy) and MA from the University of Peradeniya. He was awarded PhD (London). He is an Honorary Research Fellow (UCL England) and Fellow Wenner-Gren Foundation of New York, USA. He was the Professor and the Head of Department of Philosophy and Psychology of the University of Peradeniya. At present, he is a Visiting Professor of Universities of Peradeniya and Kelaniya.*

*"ග්‍රීෂ්ම කලාපීය වනාන්තර වේගයෙන් විනාශ වී යනුයේ කාබන්ඩයොක්සයිඩ් වායුව මුදා හැරීම සහ ජෛව ප්‍රාණීන් වඳ වී යාමත් වේලි සහ බැමි ද හතර දිග් භාගයේ ම ඉදි වීම ද නිසාවෙනි. බලශක්ති භාවිතයද 16% ගුණයකින් වැඩි වී ඇත. වසරකට මිලියන ටොන් 160 ක් පමණ වායුව මුදා හැරෙන අතර සියළු ජෛව පද්ධතින්ට නයිට්‍රජන් වැනි පොහොර යෙදවීම, නයිට්‍රජන්-ඔක්සයිඩ් නිෂ්පාදනය, ඛනිජ තෙල් දහනයන් නිසාවෙන් කාබන් ඩයොක්සයිඩ් 30% කින් වැඩි වීම සහ මීතෙන් 100% කින් වැඩිවීම, ආදී රසායනික විපර්යාසයන් රැසකට අද මිනිසා මුහුණ දී සිටී. සහශ්‍ර මිලියන 400 කට පසුව ප්‍රථම වතාවට මෙය සිදුවන අතර තවත් පරිසර විනාශයන් රාශියක් ඉදිරියට"*

**නොබෙල් ත්‍යාගලාභී රසායන විද්‍යාඥ**
**Paul Crutzen (***Climate Change 2006)*

*" හරිතාගාර වායුන් නිෂ්ක්‍රියයි. එම වායු ඉක්මනින් විසිරවීමක් සිදුනොවේ. අවකාශයට මුදාහරින හරිතාගාර වායු නො විසිරෙවන තත්ත්වය තුළ එම වායුව වසර සියයක් පමණ ඉදිරියට පවතී. ...එය කාගේවත් ප්‍රශ්නයක් නොව අපේ ම ප්‍රශ්නයකි. මනුෂ්‍ය වර්ගයා .... මුහුණ දෙන ප්‍රශ්නයකි"*

**Herman (***This Borrowed Earth* 2010*)*

*"මිනිසාගේ ජීවිතය පරිසරය මත යැපේ. එනම්, මිනිසාගේ ශරීරය යනු පරිසරයයි. එමනිසා මිනිසා ජීවත්වීමට නම් ස්වභාවය සමඟ අඛණ්ඩව සම්බන්ධයක් පැවැත්විය යුතුය. මිනිසාගේ ශාරීරික සහ මානසික ජීවිතය යන්නෙහි සරල අර්ථය වනුයේ මිනිසා ස්වභාවය සමඟ ව්‍යුහාත්මකව සම්බන්ධය යන්නය''*

**Karl Marx** *(Economic and Philosophical Manuscripts of 1844)*

## හැඳින්වීම

ධනවාදී යුරෝපයේ 18 සහ 19 වෙනි ශතවර්ෂවලින් සරල ලෙස ආරම්භ වූ පරිසර ආක්‍රමණය 20 වන ශත වර්ෂය හරහා අද වන විට ලෝකවාසීන් මුහුණ දෙන ප්‍රශ්න අතර ඉතාමත් බැරෑරුම් සහ එම නිසාම වහාම පිළිතුරක් නැතිනම් විසඳුමක් සෙවිය යුතු ප්‍රශ්නය බවට පත්ව ඇත. ජාත්‍යන්තර වශයෙනුත් දේශීය වශයෙනුත් පරිසර විනාශය උත්සන්න වෙමින් යන මේ මොහොතේ "පරිසරය සහ ජනතාව" නැමැති ශීර්ෂයෙන් 2013 වසර ආවරණය කරමින් නිකුත්වෙන *Parliamentary Research Journal* සඳහා 'පරිසර අර්බුදයට එකම පිළියම මාක්ස්ගේ පරිසර දර්ශනය පමණි', යන තේමාවෙන් ලිපියක් සපයනුයේ කාල් මාක්ස් පරිසර අර්බුදයේ සැබෑ හේතු කාරකය නිවැරැදිව හඳුනාගෙන තිබූ නිසාත්, පරිසර අර්බුදයට අද වුවද ඇති එකම විසඳුම කාල් මාක්ස් එදා සූත්‍රගත කල දර්ශණය තුළ අන්තර්ගත යැයි මෙම ලේඛකයා තිරව විශ්වාස කරන නිසාත්ය. මෙම ලිපිය ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලි බුද්ධිමත් පාඨකයින්ට සහ ශ්‍රී ලංකාවේ සහ බොහොමයක් රටවල පරිසර සංරක්ෂණය වෘත්තියක් සහ දේශපාලනයක් පමණක් කරගෙන සිටින යථානුභූතවාදී සහ යාන්ත්‍රික පරිසරවේදීන්ට 'පරිසරය පිළිබඳ මාක්ස්ගේ දර්ශණය' ගැඹුරින් හැදෑරීමට කරනු ලබන ශාස්ත්‍රීය ආරාධනාවකි.

## විධික්‍රමය සහ ප්‍රවේශය

ඕනෑම තේමාවක් අධ්‍යයනකට භාජනය කිරීමේදී ක්‍රම 2 ක් භාවිතා කළ හැකිය. එක්කෝ එම තේමාවෙහි වර්තමාන රූපයෙන් ආරම්භකොට එහි ඉතිහාසය වෙත යා හැකිවීම පළමුවැන්නය. දෙවැන්න වනුයේ එම තේමාවෙහි ඉතිහාසයෙන් ආරම්භ කොට වර්තමාන රූපය සහ ප්‍රකාශනය කර පැමිණෙමින් එහි ව්‍යුහය සහ ගතිකයන් අධ්‍යයනය කළ හැකිවීමය. උදාහරණයක් ලෙස, අපේ අවධාන-තේමාව වනුයේ 'මිනිසා' නම්, අවශ්‍යනම් මිනිසා පිළිබඳ අධ්‍යයනය අපට වඳුරාගෙන් ආරම්භ කොට වර්තමාන මිනිසා කරා පැමිණිය හැකිය. නො එසේනම් මිනිසා පිළිබඳ අප කරනු ලබන අධ්‍යයනය අපට වර්තමාන මිනිසාගෙන් ආරම්භ කොට අතීතයේ විසූ වානර මිනිසා කරා යා හැකිය. මින් කුමන ක්‍රමය අනුගමනය කළද අධ්‍යයනය අවංකවුත්, විෂය බද්ධ වූත් එකක් වීම අතවාශ්‍යය. කාල් මාක්ස්ගේ පරිසරය දර්ශනය අළලා ලියවෙන මෙම ලිපියෙහි භාවිතා කර ඇති විධික්‍රමය නම් පරිසර විනාශයේ සහ අර්බුදයේ වර්තමාන රූපයෙන් ආරම්භ කොට දෙවනුව කාල් මාක්ස් ඒ පිළිබඳව දැරූ අදහස් කරා ගමන් කිරීමය.

එයට පෙරාතුව පරිසර අධ්‍යයන ක්ෂේත්‍රයේ ජනප්‍රියව ඇති වදන් පවුලේ සාවද්‍ය හෙවත් වැරදි භාවිතය පිළිබඳ පැහැදිලි වැටහීමක් අවශ්‍ය වනුයේ පසුවට ඇතිවිය හැකි දුරාවබෝධයන් වළකා ගැනීමටත් ප්‍රස්තුත මාක්ස්ගේ පරිසර දර්ශණය නිවැරදිව තේරුම් ගැනීමටත් අත්‍යාවශ්‍ය පසුබිම එය සපයා දෙන හෙයිනි.

සිංහල ශබ්ද කෝෂයන්හි ecology[1] නැමති ඉංග්‍රීසි වචනය සිංහල භාෂාවෙන් දක්වා ඇත්තේ පරිසර-විද්‍යාව ලෙසය (උදා: මලලසේකර (2007), විජේතුංග (2005), ගම්ලත් (2008). මෙම වචනයට ඉංග්‍රීසි ශබ්ද කෝෂයන් සපයා ඇති නිර්වචනයන් ද විද්‍යාව යන අර්ථය ඉස්මතුවන සේ අර්ථ දක්වා ඇත. කොලින්ස් ඉංග්‍රීසි ශබ්ද කෝෂය Ecology යන වචනය නිර්වචනය කොට ඇත්තේ 'මිනිසුන්, සත්වයින් සහ ශාක අතර සම්බන්ධතාවන් සහ ඔවුන්ගේ පරිසරය පිළිබඳ අධ්‍යයනය" ලෙසය. *කොලින්ස් ඉංග්‍රීසි ශබ්ද කෝෂය* පමණක්

*1. 'පරිසර විද්‍යාව' ලෙස සිංහලට පරිවර්තනය කර ඇති Ecology යන ඉංග්‍රීසි වචනයෙන් හැඳින්වෙන විෂය බටහිර වෙනත් බොහෝ විෂයයන් මෙන් නූතන ධනවාදී විද්‍යාත්මක සමාජයෙන්ම බිහිවූවකි. ධනවාදය විසින් ඇති කරනු ලබන පරිසරාත්මක ගැටළු විසඳීම අරමුණු කරගෙන මෙම විෂය මෑතදී වර්ධනය කරගනු ලැබීය. 'පරිසර විද්‍යාව යනු " ජීව ප්‍රාණීන් ඔවුනොවුන් අතරත් ඔවුන් වටා ඇති පරිසරය සමඟත් ඇති කරගනු ලබන සම්බන්ධය'' ලෙස බොහෝ ශබ්ද කෝෂයන් අර්ථ දක්වා ඇත. (උදා: Mariam-Webster; Oxford; Cambridge; Collins ආදී). Ecology යන වචනය වර්ෂ 1866 දී ජර්මන් ජාතික විද්‍යාඥයෙකු වූ අර්නස්ට් හෙකල්ස් විසින් පළමුවරට භාවිතා කරනු ලැබීය. කෙසේ වුවද, මාක්ස්ගේ අදහස් 'පරිසර විද්‍යාව' යන සිංහල වචනයෙන් හෝ ecology යන ඉංග්‍රීසි වචනයෙන් දැක්වීම අනුචිතය. හේතුව, හෙකල්ස්ගේ සිට අද දක්වා පරිසරය අධ්‍යයනය කළවුන්, මාක්ස් මෙන්, මිනිසා කේන්ද්‍රයට නො ගෙන "ජීව ප්‍රාණීන් ඔවුනොවුන් අතරත් සහ ඔවුන් වටා ඇති පරිසරය සමඟත් ඇති කරගනු ලබන සම්බන්ධය ට පමණක්" අවධානය යොමු කරමින් යථාභූතවාදී (positivist) ලෙස අධ්‍යනය කිරීම නිසා පරිසරය පිළිබඳ මාක්ස් දැරූ අදහස් නියෝජනය කිරීම සඳහා 'පරිසර විද්‍යාව' නොව 'පරිසර දර්ශනය' යන යෙදුම මෙහි භාවිත කොට ඇත්තේ ක්‍රමවේදී වශයෙනුත්, දේශපාලනික වශයෙනුත් මාක්ස්ගේ පරිසර සංකල්පය සාකල්‍යයෙන්ම වෙනස් වන හෙයිනි.*

නොව ඔක්ස්ෆර්ඩ් සහ කේම්බ්‍රිජ් ආදී ප්‍රධාන පෙළේ ශබ්දකෝෂ සහ විෂයාශ්‍රිත ග්‍රන්ථ පවා Ecology යන වචනය නිර්වචනය කොට ඇත්තේ ඉහත පරිදිම ය. මෙය තේරුම් ගැනීම එක අතකින් අපහසු ද නොවෙනුයේ 'eco' යන වචනය සිංහලෙන් 'පරිසරය ලෙසත්', 'logy' යන්න සිංහලෙන් 'විද්‍යාත්මක අධ්‍යයනය' ලෙසත් අර්ථ නිරූපනයවී ඇති නිසාය[2]. එහෙත් ecology යන්නට සිංහලෙන් පරිසර විද්‍යාව ලෙස අර්ථ දැක්වීම වැරදි වනුයේ එයින් පරිසරය පිළිබඳ වාස්තවික, විද්‍යාත්මක සහ යථානුභූතික විධික්‍රම වැනි අංශයන් අති විශාල වශයෙන් ඉස්මතුකර පෙන්වීමක් කෙරෙන බැවිනි.

පරිසර විද්‍යාව ද ස්වාභාවික විද්‍යාවක් ලෙස අර්ථ දැක්වෙන නිසා විද්‍යාව යනු නිරීක්ෂණය සහ සම්පරීක්ෂණය මත පදනම් වන්නක් ලෙස ගැනීමට වචනය අපට බලකරයි. නමුත් පරිසරයට මානව මූලයකුත් ඇති හෙයින් පරිසර අධ්‍යයනයකදී නිරීක්ෂණය සහ සම්පරීක්ෂණයෙන් ලාක්ෂණික වූ දෘඪ විද්‍යාත්මක ක්‍රමයක් අනුගමනය කිරීම නො කළ යුතු වනුයේ මානව සබඳතා යනු නිරීක්ෂණය සහ සම්පරීක්ෂණය ක්‍රමයන්ට හසු නොවන සංකීර්ණ ක්‍රියාදාමයන් වන බැවිනි. පරිසරය පිළිබඳ අධ්‍යයනයට විද්‍යාත්මක අර්ථයක් පමණක් ඇතැයි ගැනීම වැරදි වනුයේ මේ නිසාය. එසේම පරිසරය අධ්‍යයනය කිරීමේ එකම විධි ක්‍රමයද දෘඪ විද්‍යාත්මක විධික්‍රමය (rigid scientific method) නොවේ. පරිසර අධ්‍යයනය යනු පටු දේශපාලන න්‍යාය පත්‍රයක මාතෘකාවක් ද නොවේ. එය එකවරම මානවවාදී ව්‍යාපෘතියක් (humanist project) සහ දාර්ශනික සුභාවිතයක්ද (philosophical praxis) වනු ලබයි. විද්‍යාව තාක්ෂණික ව්‍යාපෘතියක් විය හැකි මුත් එය දේශපාලන ව්‍යාපෘතියකින් ද සන්නද්ධ හෙයින් (තෝමස් කූන්:1971) විද්‍යාව පූර්ණ මානවවාදී ව්‍යාපෘතියක් නොවේ. විද්‍යාව තාක්ෂණය සහ දැනුම සම්පාදනයේ ව්‍යාපෘතියකි. පරිසරයට ස්වාභාවික කොටසක් ඇතුළත්ව තිබුණද සහ එය වැඩියෙන් අවධාරණය වුවද, මානව සහ සමාජ අංශයකින් ද පරිසරය සංයුක්ත නිසා (මාක්ස්, *EPM* 1844), ecology යන්න පරිසර විද්‍යාව ලෙස සිංහල භාෂාවෙන් හැඳින්වීම දෝෂ සහිතය. ඇරත් එවන් අර්ථ නිරූපනයන් ධනවාදයේම සහෝදර සංකල්පයක් වන 'ස්වාභාවික විද්‍යා සංකල්පය' සමග බද්ධව ඇති නිසාවෙන් 'මිනිසාගෙන් සමන්විත පරිසරය ' යන්නට ප්‍රතිවිරෝධයක් ලෙස එවන් නිර්වචනයක් නැගී සිටී. එහෙත් පරිසරය පිළිබඳ මාක්ස් ගේ අදහස යථානුභූතවාදී නො වනුයේ එහි පරිසර විද්‍යාව යන්නෙහි අන්තර්ගත දෘඪ විෂය බද්ධ විධික්‍රමයත් ඒ නිසාම යථානුභූතවාදයේ සීමාසහිතභාවයත් යන දෙකම අභිබවා යමින් යථාර්තයට සමීප වන බැවිනි[3].

මාක්ස් පරිසරය නිර්වචනය කරනුයේ අධ්‍යයන ක්ෂේත්‍රයක් ලෙස පමණක් සලකා නොව, ස්වභාවයෙන්ම පරිසරය මානව කේන්ද්‍රීය වී ඇති නිසාම පරිසරය මිනිසා විසින් වෙනස් කළ යුතු සහ මිනිසාට වෙනස් කළහැකි යමක් ලෙස සලකමිනි. මාක්ස්ගේ පරිසරය පිළිබද මෙම ස්ථාවරය ඔහුගේ 'ලුඩ්විග් ෆියුබා පිළිබද එකොළොස්වෙනි ප්‍රවාදය' සමඟ සෘජුවම සම්බන්ධවේ. එනම්, දාර්ශනිකයින් මේ දක්වා කර ඇත්තේ ලෝකය විවිධාකාරයට විස්තර කිරීමය. නමුත් කළ යුත්තේ ලෝකය වෙනස් කිරීමය`. (මාක්ස් : *EPM* 1844 ; *ෆියුබා පිළිබඳ මාක්ස්ගේ 11 ස්වෙනි ප්‍රවාදය*).ලෝකය සහ පරිසරය මිනිසාට වෙනස් කළ හැකියැයි මෙහිදී මාක්ස් පිළිගෙන ඇති අතර එය වෙනස් කිරීම දේශපාලන වැඩපිළිවෙළක් සමගද අනිවාර්යයෙන් සම්බන්ධ වන නිසා මාක්ස් තම පරිසර දර්ශනය දේශපාලන සුභාවිතයකින් ද (political praxis)[4] සන්නද්ධ

---

*2 Ecology යන වචනයට ග්‍රීක ප්‍රභවයක් ඇත. 'oko-(eco)+logie (science). පසුව ජර්මන්–බසින් 'okologie' ලෙස භාවිතයට යෙදින. Ecol ogy යන වචනයට සමානාර්ථ පද ලෙස ජනවහරේ භාවිත වනුයේ පරිසරය, වටාපිටාව, වාසභූමිය ප්‍රදේශය ආදියයි.*

*3 'පරිසර අර්බුදය පවතිනුයේ පරිසර විද්‍යාව (ecology) තුළ නොවේ'ය යන ස්ලවෝජ් ජිජැක් ගේ නිරීක්ෂණය සමඟ එකඟ විය හැකි මුත් (Slavoj Zizek-Censorship Today: Violence or Ecology as a New Opium for the Masses. 1 කොටස. වීඩියෝ පිටපත ), ජිජැක් ගෙන් ඔබ්බට ගොස් පරිසර අර්බුදය සඳහා යථානුභූතවාදී විධික්‍රමයකින් සන්නද්ධ පරිසරවිද්‍යාව ද වගකිව යුතුයැයි නිගමනය කිරීමට මම පෙළඹෙමි. හේතුව, පරිසර අර්බුදය පිළිබඳ කරුණු ආනුභූතිකව දැකීමට සහ එකතු කිරීමටත් ඉන් අනතුරුව අර්බුදය සඳහා පැලැස්තර පිළියම් යෝජනා කරනවා මිස පරිසර අර්බුදයෙන් සහමුලින්ම ගොඩ යන මාර්ගයක් ගැන පරිසර විද්‍යාව තුළ සැලසුමක් නැත. ඇරත්, පරිසර විද්‍යාව විෂයක් ලෙසත් පරිසරවේදීන් පුද්ගලයින් ලෙසත් සිටිනුයේ ධනවාදී කඳවුරේය.*

*4 ඇරිස්ටෝටල්ට අනුව praxis යනු මානවයාගේ ප්‍රධාන ක්‍රියාකාරකම් තුනෙන් එකකි. අනෙක් දෙක වනුයේ න්‍යාය (theory) සහ භාවිතයයි (poesies) එනම්, ශිල්පීය කර්මාන්තය ආශ්‍රිත නිශ්ටාභිප්‍රේරිත ක්‍රියාවයි. ඉමානුඑල් කාන්ට් ට අනුව praxis යනු මිනිසා ලබන අත්දැකීම් (theorial) තේරුම් ගැනීම සඳහා පවතින විප්ලවකාරී ක්‍රියාදාමයකි. මාක්ස්ට අනුව praxis යනු ලෝකය වෙනස්කිරීමේ දේශපාලන දාර්ශනික භාවිතයයි.*

කර තිබෙන හෙයින් මාක්ස්ගේ පරිසරය පිළිබඳ විග්‍රහයට ecology යන ඉංග්‍රීසි වචනය හෝ එය 'පරිසර විද්‍යාව' ලෙස සිංහලෙන් දැක්වීම දෝෂ සහිත යැයි මා ඉහත කළ ප්‍රකාශය නැවතත් සහ තව දුරටත් සනාථ වෙයැයි හඟිමි. මේ නිසා පරිසරය පිළිබඳ මාක්ස්ගේ අදහස ඉදිරිපත් කිරීමේදී මාක්ස් අග්‍රගන්‍ය පරිසර දාර්ශනිකයෙක් බව ලෝකයට හඳුන්වා දුන් අද පළමු ගණයේ මාක්ස්වාදී පරිසර චින්තකයෙකුවූ ජෝන් බෙලාමි ෆොස්ටර් අනුව වුවද නො යමින් මාක්ස්ගේ පරිසර චින්තනයට *"පරිසර විද්‍යාව"* යන්න භාවිතා නො කොට මාක්ස්ගේ "පරිසර දර්ශනය" යන්න මෙම ලිපිය පුරාම භාවිතා කොට ඇත[5]. එහෙත් පරිසරය ස්වාභාවික වස්තුවක් ලෙස සලකා නිරීක්ෂණය සහ සම්පරීක්ෂණ විධික්‍රම භාවිතයෙන් ස්වාභාවික ක්‍රියාවලිය යථානුභූතවාදී ලෙස අධ්‍යයනය කරන විෂයයකට පරිසර විද්‍යාව යන්නත්, පරිසරය පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනයේ යෙදෙන්නන්ට පරිසර විද්‍යාඥයින්, එනම් 'ecologists' 'environmental scientists', සහ 'eco-scientists' යන වදන් මෙම ලිපිය පුරා භාවිතා කොට ඇත්තේ මාක්ස්ගේ ගැඹුරු සමාජවාදී න්‍යාය පත්‍රයෙන් සහ ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන් වෙන් කොට හඳුන්වා දීම පිණිසය. මෙම ලිපියෙහි මිනිසා සමග මිනිසා අවට ප්‍රදේශය හැඳින්වීමට කාල් මාක්ස් අනුව යමින් පරිසරය (environment) සහ ස්වභාවය (nature) යන වචන පර්යාය වශයෙන් යොදා ඇති බව කරුණාවෙන් සලකන්න.

## පරිසර විනාශයේ හේතුකාරක රූප ද්වය

### *ස්වාභාවික හේතුකාරකය*

පරිසර විනාශය ප්‍රධාන ක්‍රියාදාමයන් දෙකක් නිසා සිදුවේ. එකක් නම් ස්වාභාවික වශයෙන්ම ඇතිවන විනාශයන්ය. දෙවැන්න, නම් මිනිස් ප්‍රභාවාත්මක පරිසර විනාශයන්ය. එනම්, Anthropogenic Ecological Disasters ලෙස හැඳින්වෙන මිනිසාගේ මැදිහත් වීමෙන් පරිසරයට වන හානිය හෝ සිදුවන පරිසර විපර්යාසය හෝ දූෂණයයි. *"මෙහිදී මිනිසාගේ මැදිහත් වීම"* යන වාක්‍ය ඛණ්ඩයේ අර්ථය පැහැදිලිව වටහා ගැනීම අත්‍යවශ්‍ය වනුයේ ස්වභාවික පරිසර විපත් මෙම ලිපියෙහි තේමා සංදර්භය තුළ පිහිටු වීමට පෙර පරිසර විනාශයට සම්බන්ධ මිනිස් දෙවර්ගය වෙන්කර වටහා ගැනීම වැදගත් වන හෙයිනි.

ජීවත්වීම සඳහා මිනිස්සු පරිසරය මත යැපීම එදා කළා මෙන් අද ද කරති (හොඳම උදාහරණය ධීවරයින්ය).මිනිසා විසින් අතීතයේදී කරනු ලැබූ සහ අදත් ජීවත්වීම සඳහා කරනු ලබන *"නොකර බැරි නැතිනම්, අනිවාර්ය අරගලය"* නිසාවෙන් පරිසරය දූෂණයට ලක්වේ නම් එය ඔහුගේ පැවැත්ම නැතිනම් *"ජීවිතය ගැට ගසා"* ගැනීම පිළිබඳ කරුණට සම්බන්ධ සාංදෘෂ්ටිකවාදී ප්‍රශ්නයකි (Existential Issue). ජීවත්වීම සඳහා වළං තැනීමේදී මැටි පිළිස්සීමෙන් සිදුවිය හැකි පරිසර දූෂණය හෝ කෘෂිකර්මයේ නිරතවීම සඳහා යපස් දහනය කිරීමේ දි සිදුවන පරිසර දූෂණය වැළැක්විය හැකි ක්‍රියාදාමයන් නොවේ. හේතුව, එම ක්‍රියාවන් "මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ ස්වාභාවික නීතියට හෝ ධර්මතාවයට අනුකූලව සිදුවන බැවිනි. පරිසර විනාශයට වග කිවයුතු මිනිසා මොහු නොවේ. පරිසර විනාශයට වගකිව යුතු මිනිසුන් වනාහී "බහු-සමාගම්කාර මිනිසුන්ය"; ධනවාදී-කොම්පැණිකාර බලවතුන්ය"; බහු-ජාතික තෙල් ව්‍යාපාරිකයින්ය. කෝටිපති තෙල් පිරිපහදුකාර මිනිසුන්ය. ලෝකය පුරා විසිරී සිටින මොවුන් ලෝක ජනගහනයෙන් 0.2% නො ඉක්මවූවද සහ ඔවුන්ගේ ප්‍රතිශතය ඉතාමත් සුළු වුවද ඔවුන් බලවත් සුළුතරයකි. එහෙත් මොවුන්ද මිනිස් කුලකයට නෛසර්ගිකවම අයත් වන නිසා ලෙහෙසියටත් සට කපට ලෙසත් 'පරිසර විනාශයට හේතුව මිනිසා යැයි' සරළ ලෙස සමාජ ගත වෙන විට පරිසරය සැබෑ ලෙස සුරාකන්නන්ට එය බාහිරින් සැපයෙන ආරක්ෂණ යාන්ත්‍රණයක්වීම (external

5 *එසේම මිනිසාගේ මැදිහත් වීමෙන් පරිසරයේ පරිණාමනයක් (transformation) කළ හැකිය සහ එය සාර්ථක කරගත හැක්කේ සමාජවාදී දේශපාලන වැඩ පිළිවෙළකින්ය යන මාක්ස්ගේ ප්‍රධාන අවධාරණය "පරිසර විද්‍යාඥයින්" සහ විද්‍යාඥයින් නො සළකා හැර තිබෙන තත්ත්වය තුළ පරිසරය පිළිබඳ මාක්ස්ගේ අදහස් සමාජ ගත කිරීමේ මෑත පුරෝගාමියා වන ජෝන් බෙලාමි ෆොස්ටර් පවා මාක්ස්ගේ පරිසරය පිළිබඳව සාකච්ඡා කරනුයේ ecology යන ඉංග්‍රීසි වචනය භාවිතා කරමිනි. ඔහුගේ කෘතියෙහි ශීර්ෂය Marx's Ecology: Materialism and Nature (2000). එසේම ගෘන්ඩ්මාන් ද සිය කෘතිය සඳහා යොදන ශීර්ෂය ද Marxism and Ecology (1999) යන්නය. මොවුන් දෙදෙනාම මාක්ස්ගේ පරිසරය පිළිබඳ දර්ශනය යථානුභූතවාදී නිර්වචනයකින් යුතු ecology ලෙස දක්වන්නේ මන්ද යන්න මට ගැටළුවකි.*

defense mechanism) වාසියකි. එහෙත් මෙය බරපතළ අසාධාරණයකි. එසේ වනුයේ සැබෑ පරිසරනාශකයාගේ, 'ධනපති','කොම්පැණිකාර', 'මෙගා ව්‍යාපාරික', 'බනිජ-තෙල් නිධි කුවේර ', 'අධිරාජ්‍යවාදී' යන සංයුක්ත විශේෂණ (concrete adjectives) ඉවත්වී එම විශේෂණයන්ට කෙසේවත් උරුමකම් කිව නොහැකි නිර්ධන පංතික ප්‍රකෝටි ගණනක් වන අහිංසක මිනිසුන් 'මිනිසා' නැමති වියුක්ත කුලකයට (abstract class) ඇතුළත් කිරීම බලවත් අසාධාරණයක් වන හෙයිනි.මෙවැනි ක්‍රියාවන් පිටුපස ඇති හස්තය වෙනත් එකක් නොව බලවත් ධනවාදි දෘෂ්ටිවාදී හස්තය සහ එහි බලපරාක්‍රමයයි.

### ස්වාභාවික පරිසර විපත්

වසර මිලියන ගණනාවක සිට භෞතික රසායනික සහ දේශගුණික හේතු නිසා ස්වාභාවික පරිසරයත් එහිම කොටසක් වන සත්ව සහ මිනිස් ප්‍රජාවත් වරින් වර විනාශ වූ බවට සාධක එමට ඇත. මීට වසර **74,000** කට පෙර ලිටොබා විල ආශ්‍රිත ව්‍යසනය, මායන් අධිරාජ්‍යයේ (ක්‍රි. ව. **800 - 1000)**, විසුවියස් (ක්‍රි.ව. **79)**, තම්බෝරා (1915), ශාන්ත හෙලේනා (1980), ඉන්දියාවේ (1770), ප්‍රසියාවේ (1708), නෙදර්ලන්තයේ සාගත, ලූෂියාහි (1287) සහ චීනයේ (1937) ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ ගංවතුර ගැලීම් ආදිය ප්‍රධාන ස්වාභාවික ව්‍යසනයන් ලෙස ඉතිහාස ගතවී ඇති අතර එම ස්වාභාවික ඛේදවාචක අද වූවද අපගේ හදවත් සසල කරනු ලබයි. එසේම මෑතදී සිදුවූ පහත ස්වාභාවික ඛේදවාචක මොන තරම් අපව සසල කළාද?.

- ◊ තාප තරංග (heat waves) ඉලිප්පීම නිසා 2005 වසරේදී සිදුවූ කාශ්මීර භූමි කම්පාව (මරණ සංඛ්‍යාව 88,000)
- ◊ මියන්මාරයේ බෙංගාල බොක්ක ආශ්‍රිතව 2008 වසරේදී හමාගිය නර්ගීස් කුණාටුව (මරණ සංඛ්‍යාව 1,40,000)
- ◊ 2008 වසරේදී සිදුවූ චීනයේ සිචුවාන් (Sichuan) භූමි කම්පාව (මරණ සංඛ්‍යාව 2,23,000)
- ◊ ඉන්දියානු සාගර වෙරළ හරහා 2004 වසරේදී සිදුවූ සුනාමිය (මරණ සංඛ්‍යාව 2,50,000)
- ◊ 2010 වසරේදී සිදුවූ හයිටි දූපත් භූමිකම්පාව (මරණ සංඛ්‍යාව 2,23,000)
- ◊ කොංගෝවේ 1977 වසරේදී පුපුරා ගිය ගිනිකන්ද
- ◊ දකුණු එක්සත් ජනපදයේ ලූසියානා සහ මිසිසිපි ප්‍රාන්ත හරහා හැමූ කැතරිනා සුළි සුළඟ

සහශ්‍ර ගණනාවක් පුරා මෙවැනි ස්වාභාවික ආපදා මධ්‍යයේ මිනිස් ඉතිහාසය ඉදිරියට ඇදුණි. මෙවැනි ස්වාභාවික විපත් මිනිසාගේ පාලනයෙන් ඔබ්බෙහි පැවති අතර අද ද ඒවා පවතිනුයේ මිනිසාගේ පාලනයෙන් පරිබාහිරවය. ඒ නිසාම ඒවා ස්වාභාවික ආපදා (natural disasters) යනුවෙන් හැඳින්වේ. සුනාමිය, සුළි කුණාටු, ගිනිකඳු පුපුරා යෑම්, ජලගැලීම් සහ භූමිකම්පා ආදිය සම්බන්ධයෙන් වගකීම මිනිසාට පැවරිය නොහැකි වනුයේත් ස්වාභාවික ව්‍යසනයන් සම්බන්ධයෙන් මිනිසාට දෝෂාරෝපණය කළ නොහැක්කේත් මේ නිසාය. ඒවා මිනිසාට ආපදා වුවද ඒවා ස්වභාවයේ නියාමය සහ චර්යාව තුළ මිලියන ගණනාවක් ම හැසිරී ඇත්තේ මෙසේය. ඉදිරියටද ස්වභාවයේ හැසිරීම මෙය වනුයේ එය ස්වභාවයේ සැබෑ ස්වාභාවය වන නිසාමය.

### සැබෑ පරිසර දූෂක මිනිසා

ධනවාදය සහ ධනවාදීන් නිසා සිදුවූ පහත සංක්ෂිප්තව පෙළ ගස්වනු ලබන ව්‍යසනයන් ස්වාභාවික විපත් නොව මූල්‍ය ලාභ සමුච්චනය (profit accumulation) කෙරෙහි ඇති අසංවර, අමානුෂික සහ අසීමිත කෑදර කම නිසාවෙන් වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම ධනවාදය විසින් ඉතා සූක්ෂම ලෙස කරනු ලැබූ අපරාධයන්ය (meditated crime). අධිරාජ්‍යවාදීන් සහ ධනවාදී බහුජාතික සමාගම් ලාභ ලැබීමේ එකම අරමුණින් ස්වභාවයත්, ස්වභාවයේ කොටසක් වන මිනිසාත්, අනුකම්පා විරහිතව සූරාකෑමේ අධිෂ්ඨානයෙන් අභිප්‍රේරණය වී සිදුකරනු ලැබූ සහ අදද සිදුකරන පරිසර විනාශයන්ය.

විසිවෙනි සියවසේ ආරම්භයේ සිටම පාහේ අධිරාජ්‍යවාදීන්ගේ යුද උන්මාදය නිසා විනාශවී ගිය ධනය, බලය සහ ආර්ථිකය ශක්තිමත් කරගැනීමටත්, එසේම ධනවාදය නිරන්තරයෙන්ම කඩාබිඳ වැටීම නිසාවෙන් එය ශක්තිමත් කරගැනීමටත්, ධනවාදීන් සහ අධිරාජ්‍යවාදීන් විසින් කරනු ලැබුවේ "කෙසේ හෝ" මුදල් ඉපැයීම එකම අරමුණ කර ගැනීමය. ඒ අරමුණ ශාක්ෂාත් කරගැනීම සඳහා

සැදී පැහැදී එකතු වුනු බහු-ජාතික තෙල් සමාගම්, පතල් කර්මාන්ත අධිපතීන් සහ අඩු වේතනයකට ආසියානුවන්ගේ ශ්‍රමය ඩැහැගනු ලැබූ ඇඟළුම් කර්මාන්ත ශාලා හිමියන්, ධනේශ්වර සමාගම් සහ ආයතන මෙන්ම අන්‍යෝන්‍ය අවබෝධයකින් යුතුව ක්‍රියාත්මක වෙනු ලබන දේශපාලකයින් යන මේ සියළු දෙනාම පසුගිය දශක **4** තුළ කළ බොහෝ දෑ ස්වාභාවික පරිසරය සහ මිනිස් ජීවිත විනාශ මුඛයට හෙළූ ආකාරය පෙන්වන මෑත ආනුභූතික ඓතිහාසික ශාක්ෂීන් වී අවසානය. ලැයිස්තුව ඉතා දිගමුත් මෙහිදී ඉතාමත්ම බරපතළ පරිසර සහ මානව විරෝධී වූ ව්‍යසනයන් කිහිපයක් සහ තරඟකාරි වාණිජ ක්ෂේත්‍රය තුළ "හැකි ඉක්මණින් වැඩි මුදලක් අඩු වියදමකින්" සොයාගැනීමේ ධනවාදී උත්සාහයේදී සිදුකරන ලද "පරිසර අපරාධයන්" කිහිපයකුත් පිළිබඳව අප දැනගතයුත්තේ ධනවාදයේ වර්ධනයේදී මනුෂ්‍යයාට මෙම ඛේදවාචකයන්ට මුහුණදීමට සිදුවීම අනිවාර්ය බව කාල් මාක්ස් පරිසර අර්බුදය පිළිබඳ රෝග විනිශ්වයේදී පුරෝකථනය කර තිබූ බව පෙන්වා දීමට අවශ්‍ය නිසාත් පසුගිය වසර **10** තුළ ධනවාදීන් පරිසරයට සහ මිනිස් ජීවිතවලට කළ විනාශය සිහිපත් කර ගැනීම අවශ්‍ය නිසාත්ය.

පරිසර දූෂක මිනිසාගේ ක්‍රියාකාරකම් මෙහි පෙළගස්වනු ලැබ ඇත්තේ කාල වක්‍රානුකූලව නොව පරිසරය සහ මිනිස් ජීවිත විනාශ වූ ප්‍රමාණයේ ධාරිතාවට සාපේක්ෂකවය. ධනවාදයේ ප්‍රාණ වායුව ලෙස තවමත් සැලකෙන ඛනිජ තෙල් නිෂ්පාදනය, පිරිපහදුව, සහ ප්‍රවාහනය ආදියෙන් සමන්විත ක්ෂේත්‍රයන් ධනවාදීන්ගේ මානසිකත්වයේ යථාර්ථයත් පරිසරය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ සැලකිල්ලත් අපූරුවට කැඩපත් කරනු ලබයි. බොහොමයක් පරිසර සහ මිනිස් ජීවිත විනාශයන් ඛනිජ තෙල්, මිනිරන් පතල්, ආරක්ෂක සහ ඇඟලුම් ක්ෂේත්‍ර කේන්ද්‍ර කරගෙන සිදුව ඇති බවට මෑත ඉතිහාසය ශාක්ෂි දරයි. මේ සියල්ලක්ම පොදු මිනිසාගේ අවශ්‍යතාවන් වුවා හෝ නැතා හෝ තණ්හාධික ධනපතියාගේ මූල්‍ය ප්‍රතිලාභ මනෝ ව්‍යයාධියක වාස්තවික ප්‍රකාශනයන්ය.

බහු ජාතික ඛනිජ -තෙල් සමාගම්, පතල් හිමියන්, ඇඟලුම් සහ ආහාරපාන කර්මාන්ත ශාලා හිමියන් ලාභාපේක්ෂාවෙන් ප්‍රේරණය වීමේ සහ ඒ නිසාවෙන්ම සිදුවන නොසැලකිලිමත්භාවය හේතුවෙන් පරිසරය කෙලෙසුවේ පරිසරයේ අද්විතීය කොටස වූ මිනිසුන්ගේ පමණක් නොව සත්ව ජීවිතද ලක්ෂ ගණනින් විනාශ කරමිනි. උදාහරණ ස්වල්පයක් දෙස බලමු;

- ◊ 1976 වසරේදී ඉතාලියෙහි මීඩාහි ICMESA රසායනික බලාගාරයෙන් වහනය වූ විෂවායු නිසාවෙන් ගොනුවුනු වළාවන් හේතුවෙන්,
- ◊ 1986 වසරේදී රුසියාවේ Chernobyl න්‍යෂ්ටික බලාගාරයේ පිපිරීමෙන්,
- ◊ 1979 වසරේදි පෙන්සිල්වේනියාවේ Three Miles Island හි මිදී ගිය විකිරණයන්ගෙන්
- ◊ 2005 වසරේ ටෙක්සාස් තෙල් පිරිපහදුවේ විශාල පිපිරීමෙන්,
- ◊ 2008 වසරේ Fifer Alfa සමාගමේ න්‍යෂ්ටික බලාගාරය පුපුරා යාමෙන්,
- ◊ 2010 වසරේ බ්‍රිතාන්‍ය ඛනිජ තෙල් සමාගමට අයත් Deep Horizon පිරිපහදුව මෙක්සිකෝ බොක්කෙහි දී පුපුරායාමෙන්,
- ◊ 2011 වසරේ ජපානයේ ෆුකුෂිමා (Fukushima) න්‍යෂ්ටික බලාගාරයේ පිපිරීමෙන් සහ
- ◊ 2006 වසරේදී නයිජීරියාවේ තෙල් ඉහිරියාමෙන්[6],
- ◊ 2012 වසරේ රේන්බෝ විල ආශ්‍රිත තෙල් ඉහිරියාමෙන්,
- ◊ 2012 වෙනිසියුලා තෙල් කාන්දුවෙන්,
- ◊ 2013 මේෆ්ලවර් තෙල් කාන්දුවෙන්,
- ◊ 2013 තායිලන්තයේ තෙල් ඉහිරීයාමෙන්,

ආදී වශයෙන් පසුගිය දශක තුනේදී මෙවැනි අනතුරු සිය ගණනින් සිදුවී ලෝකයේ ජල සහ හරිත සම්පත් ධනවාදීන් විසින් විනාශ මුඛයට ඇද දමන ලදී.

*6. පසුගිය වසර පහ තුළ තෙල් ඉහිරී යාම් 7000 ක් පමණ වාර්තා වී ඇති අතර වසරකට මෙවැනි ඉහිරීම් 300 ක් පමණ සිදුවන බව BBC ප්‍රවෘත්ති සේවය| වාර්තා කොට තිබිණ. 1998 වසරේ තෙල් ටැංකි පිපිරීමෙන් පමණක් ජීවිත1000 කට ආසන්න ප්‍රමාණයක් විනාශ විය.*

එහෙත් මෑත ඉතිහාසයේ විශාලතම කර්මාන්ත ශාලා ඛේදවාචක දෙක වූයේ 1984 වසරේ Union Carbide India සමාගමට අයත් ඉන්දියාවේ බෝපාල් හි පිහිටි වැඩ-බලාගාරය පුපුරායාමේ ඛේදවාචකය (බ්‍රෞටන්:2005; එකර්මන්: 2005; ඩී.ටී.සිල්වා: 2006) සහ 2013 මැයි මස බංගලාදේශයේ විදේශීය සමාගම් සතු රානා ප්ලාසා ඇඟලුම් කම්හල් ගොඩනැගිල්ල බිඳ වැටීමේ ඛේදවාචක දෙකයි. බෝපාල් පුපුරා යාමෙන් ඒ මොහොතේම 3000 ක්ද සති 2ක් ඇතුලත 8,000 ක් ද වසර පහක් තුළ 15,000 ක් ද මරණයට පත් වූ අතර ලක්ෂ **5**කට ආසන්න ජනතාවක් සදාකාලික රෝගීන් වූහ. මෙම ඛේදවාචකයට Union Carbide India සමාගම වගකිව යුතු බවත් අති-ප්‍රමාණිකව ගෑස් ගබඩා කිරීම, කලට වේලාවට නඩත්තු නොකිරීම, ආරක්ෂක පද්ධති දුර්වල තත්ත්වයක පවත්වා ගෙන යාම, මුදල් ඉතිරිකිරීමේ අරමුණින් ආරක්ෂක යාන්ත්‍රණ විදුලි පද්ධති අක්‍රියව තැබීම, ඉතා අනතුරුදායක වර්ගයේ කෘමී නාශක භාවිතය, පුහුණු සේවකයින් සේවයේ නොයෙදීම, ආදිය මෙම ඛේදවාචකයට හේතුවූ බව බෝපාල් නඩුවේදී එළිදරව් විය. විපතට පත්වූවෙකුගේ ඥාතියකු උසාවියේදී කළ පහත ප්‍රකාශය මගින් බෝපාල් ඛේදවාචකයේ පසුබිම් සත්‍යය පෙන්නුම් කෙරේ. ‘අපට මෙම අනතුර සිදුකළේ පොහොසතුන් සහ බලවතුන්ය. අපේ ජීවිත නැතිවුනේ ඔවුන් මුදල් වලට පෙන්වූ අසීමිත පෙරේත කම නිසාය. එහෙත් අපට දුක වරද කළවුන් එකෙකු හෝ එක දවසකට හෝ හිරේට නොයාමය., (හමීඩ්, විපතට පත්වූවෙක් බෝපාල් නඩුව. (*Bhopal Trial* 2008 BBC Report චන්ද්‍රශේකර් 2006)[7].

2013 වසරේ මැයි මස බංග්ලාදේශ ඛේදවාචකයෙන් 1,300 ක් පමණ මියගිය ගොස් තවත් දහස් ගණනක් බරපතළ තුවාළ ලැබූ අතර එම ඛේදවාචකයේ වගකීම බාරගනු ලැබුවේ එම ආයතන හිමි බ්‍රිතාන්‍යයේ Primark සහ කැනඩාවේ Loblaw නැමැති ධනපති ඇඟලුම් සමාගම් දෙක වන අතර මියගිය අය වෙනුවෙන් විශාල වන්දි මුදලක් ගෙවනු ලැබුවේ ද එම සමාගම් දෙක විසිනි.

ජීවිතය ගැට ගසා ගැනීම සඳහා ශ්‍රමය කැපකරන මිනිසාගෙන් හෝ ධනවාදී ක්‍රමය තුළ මධ්‍යම හෝ පහල මධ්‍යම පංතික රැකියාවක් කරනු ලබන මිනිසාගෙන් පරිසරය මහා පරිමාණ වශයෙන් දූෂණය වීමේ ඉඩකඩ සීමිතය. ඉහත පොදු මිනිසාගෙන් පරිසරය අපවිත්‍ර වීම කෙරෙන බව සැබෑය. එමෙන්ම මිනිසාට වැළැක්විය නොහැකි ස්වාභාවික ව්‍යසනයන්ගෙන්ද දේශගුණික කලාපයන්, ජලාශ්‍රිත සත්වයන් සහ තෘණලතා විනාශවීම නො සිදුවනවා නොවේ. එහෙත් මෙම ලිපියේ ඉහත දැක්වූ පරිදි ඒ පිළිබඳව සාමාන්‍ය ජනතාවට කළහැකි දෙයක් නො මැති අතර එම සංසිද්ධීන් වරින්වර ඓතිහාසිකව සිදුව ඇති අතර අද ද සිදුවේ. එසේම එම සිදුවීම් වලින් වායුගෝලාශ්‍රිත හරිතාගාර වායු වලට (Green House Gases- GHG) එනම් කාබන් ඩයොක්සයිඩ්, මීතේන්, හයිටෝ ඔක්සයිඩ් සහ ඕසෝන් ආදිය නිපදවීමේ හැකියාවක් පැවතිය ද සහ එමෙන්ම එවැනි වායු නිපදවීමක් ඉතිහාසය තුළ සිදුව තිබුන ද ජීවියාගේ පැවැත්මට අනතුරුදායක මෙම වායු මිනිස් මැදිහත්වීමකින් නිෂ්පාදනය වී වායුගෝලයට විසිරෙනුයේ නම් සහ එම විසිරවීම් ඉවක් බවක් නො මැතිව සිදුවන්නේ නම් එය බරපතළ විනාශයක පෙර නිමිත්තකි. මෙය සිදුකරනුයේ ප්‍රාග්ධනය හිමි, පරිසරයට හෝ මිනිස් වර්ගයාට ආදරය නො කරන මුදල් පමණක් පසුපස හඹායන ධනවාදී ව්‍යාපාරිකයින්ය.

පරිසර අර්බුදයට පිළියම් ලිබරල්වාදී ක්‍රියාන්විතයන්, හරිත ව්‍යාපාරයන් (green movements) සහ පරිසර හිතකාමීන්ගේ සරල ප්‍රතිචාර තුළ දැකිය නො හැකි වනුයේ භාවාත්මක සහ පක්ෂග්‍රාහී වෙනවාට අතිරේකව ඔවුන් භාවිතා කරනු ලබන විධික්‍රමය යථානුභූතවාදී වීම (positivist) නිසාවෙනි. මේ සඳහා පසුගිය ශතවර්ෂය පුරාම පාහේ පිළියම් සොයන පරිසර හිතවාදීන් මෙන්ම පරිසර විද්‍යාඥයින්ද විසඳුමක් සඳහා සාරගර්භ විධික්‍රමයක් සොයා ඉදිරිපත් කරනු වෙනුවට කරනු ලැබුයේ දීර්ඝ ඉතිහාසයක් ඇති සරල ආනුභූතික නිරීක්ෂණ ඉදිරිපත් කිරීම පමණි. ඉන් ප්‍රධානතම සහ බහුලව කෙරුණු නිරීක්ෂණය වනුයේ “පරිසර විනාශයන්

*7. නඩු විභාගයෙන් අනතුරුව වැරදිකරුවන්ට දඬුවම් ලැබුනුමුත් සමාගම් හිමිකරුවෝ ඉන්දියානු බලධාරීන්ගේ පිහිටෙන් ගැලවී විදේශ ගත වූහ. මින් පැහැදිලි වනුයේ ද ක්‍රමයේම පවතින ජරාජීරණ භාවය සහ තත්වාරක්ෂක රූපයයි.*

සිදුවනුයේ පරිසර සමතුලිතතාවය (environment equilibrium) බිඳීයාමෙන්ය", යන්න පුන පුනා අවධාරණය කිරීමය. පරිසර දූෂණයේ සහ අර්බුදයේ බරපතළකම දෛනිකව තීව්‍ර වන හෙයින් අපට අවශ්‍ය වනුයේ මෙවැනි පස්වෙනි පංතියේ ස්වභාව අධ්‍යයන පාඩමක ගුරුතුමියක් උගන්වන ' ස්වභාවධර්මයේ සමතුලිතතාවය බිඳීම' වැනි සරල නිරීක්ෂණයක් නොවේ. මෙවැනි නිරීක්ෂණයන් කර්ම කාරකව ඉදිරිපත්වන නිසා පරිසර දූෂණය කිරීමේ සත්‍ය කර්තෘ කාරකය මෙම නිරීක්‍ෂණයන් විසින් අස්ථානගත කරනු ලබන අතර එම අපරාධය සැහැල්ලුවට ද ලක් කෙරේ. මෙයින් පරිසර අර්බුදයට සහ පරිසර විනාශයට සෘජුව වගකිවයුතු සත්‍ය කර්තෘකාරකයින් වන ධනපතියන්ට සහ අධිරාජ්‍යවාදීන්ට මෙවැනි නිගමනයන්හි සැඟවී රැකවරණය ලැබිය හැකිය. සමතුලිත සංකල්පය ඔවුන්ව ආවරණය කරන නිසාවෙන් ඔවුන් එහි අවධාරණයට එක හිතින්ම කැමතිය.

බටහිර පරිසර විද්‍යාඥයින් පමණක් නොව ශ්‍රී ලංකාවේ පරිසර අධිකාරිය, පරිසරවේදීන් සහ භූගර්භ විද්වතුන් ද පරිසර අර්බුදයට කල්පවතින විසඳුමක් සහ ඥාණාන්විත තර්කයක් ගොඩ නඟනු වෙනුවට කරනුයේ, 'සමතුලිතතා නිරීක්ෂණය' ඉදිරියට දැමීමය. ස්වාභාවික විපත් සහ පරිසර අර්බුදය පිළිබඳව සම්මුඛ සාකච්ඡාවක යෙදෙන හිටපු භූ විද්‍යාඥයකු වූ විල්බට් කෙහෙල්පන්නල මහතා ගංවතුර, නියඟය, ගිනි කඳු පිපිරීම්, නායයෑම්, භූමිකම්පා ආදිය නිසා පරිසරයේ සමතුලිතතාවය බිඳී යන බව නිවැරදිව නිරීක්ෂණය කරයි (මහාචාර්ය කෙහෙල්පන්නල, ***ලංකා*** පෙබ. 10.2013). එසේම ඔහු සාකච්ඡාව අතරවාරයේ දී නායයෑම් වැනි ක්‍රියාකාරකම් වලට "මිනිසා වගකිවයුතුය" යන්නද අවධාරණය කරමින් සැලැස්මක් නො මැතිව සහ පාරිසරික ශක්‍යතා පිළිබඳ පූර්ණ ඇගයිමක් නො මැතිව කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති නිසා පරිසර විපත් වලින් මිනිසා පීඩා විඳින බවක්ද පෙන්වා දෙයි. නමුත් පරිසරය විනාශ කරමින් අවස්ථාවාදී දේශපාලනයක යෙදෙමින් කරනු ලබන සංවර්ධනය කුමකට ද? ඔහු ඇඟිල්ල දිගු කරනුයේ දේශීය-දේශපාලන මිනිසාට (local politician) බව පැහැදිළිය. එහෙත් මෙය වුවද අර්ධ සත්‍යයකි. අනාවරණය කළයුත්තේ සැබෑ සහ අති-අනර්ථකාරී පරිසර දූෂකයින් සහ පරිසර විනාශකාරී ධනවාදීන්ය.

පරිසර විනාශයට පැහැදිළිව ම වගකිවයුතු වනුයේ ජාත්‍යන්තර මට්ටමින් වාණිජ්‍යයේ නියුතු විශාල සමාගම් සහ අධිරාජ්‍යවාදීන්ය. ඔවුහු සෘජුවම පරිසර අර්බුදයේ නිර්මාතෘවරු වෙති. 'පරිසර අර්බුදයට මිනිසා වගකිවයුතුය' යන්නෙහි 'මිනිසා' කවිදැයි යන්න අනුසීමා මායිම් කොට ඉදිරිපත් කළයුතු වනුයේ පරිසර අර්බුදයෙන් පීඩා විඳින කෝටි සංඛ්‍යාත අසරණ දුගී දුප්පත් මිනිසාද 'පරිසර දූෂක මිනිසා' නැමැති කුලකයකට ඇතුලත් වන හෙයිනි. පරිසර දූෂණයේ වගකීම මිනිසාට පොදුවේ පැවරීමට බටහිර ධනපතීන් පමණක් නොව ශ්‍රී ලංකාවේ දේශපාලනඥයින්, (ගම්පහ රතුපස්වල ජලය අපවිත්‍ර කරනු ලැබුවේ එම ප්‍රදේශයේ ජනතාව නොවේ) සහ ධනපති ව්‍යාපාරිකයන් පමණක් නොව ශ්‍රී ලංකාවේ රජය සහ මධ්‍යම පරිසර අධිකාරිය ද පෙරට ඒම අහම්බයක් නොව උපක්‍රමශීලි දෘෂ්ටිවාදයක් දැනුවත්ව හෝ නො දැනුවත්ව සමාජගත කිරීමකි. මෙයින් පෙනෙනුයේ පරිසරයත් ඒ තුළ ජීවත්වන සාමාන්‍ය මිනිසාත් යන දෙ වර්ගයම සූරාකනු ලබන්නන් පිළිබඳව මොවුන් තුළ ඇති අනවබෝධයයි.

අනෙක් අතට පරිසර අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් මෙන්ම නිරෝගී පරිසර සංකීර්ණයක් ජනතාවට ප්‍රදානය කිරීමට සපථ කරන්නෝ ද පරිසර අර්බුදය පිළිබඳව නිවැරදි රෝග විනිශ්චයකට නො යමින් එයට හේතුව කිසිම විශේෂණයකින් තොරව "මිනිසාගේ ක්‍රියාකාරිත්වයන්" යැයි නිගමනය කරන්නෝය.; එසේ යැයි ජනතාවට පවසන්නෝය; පරිසරය සහ දේශගුණය පිළිබඳව ලියන රචනාවන්හි ද ඔවුහු එය අවධාරණය කරති. පරිසර දූෂක මිනිසා කවරෙක්දැයි යන්න අනුසීමා නො පනවමින් සහ කොන්දේසි විරහිතව පළ කිරීමේදී ඔවුන් ප්‍රදර්ශනය කරනුයේ පරිසර අර්බුදය සහ එහි විසඳුම් සඳහා ඔවුන්ගේ දැනුමේ පරිමිතය පෙන්වීමත් පරිසර විනාශයට හා අර්බුදයට හේතුව "වියුක්ත" මිනිසෙකු මත පැටවීමේ සදාචාර විරෝධී ක්‍රියාවට ද හවුල් කරුවන් වීමත්ය. "පරිසර දූෂණයට ධනපති ක්‍රමය වගකිවයුතුය" යන ප්‍රගතිශීලී අදහස දරන්නන් හැරෙන්නට අවස්ථාවාදී, කුහක දේශපාලකයින් සමාජ ගත කොට ඇති මතය වනුයේ මෙම මහා අපරාධයට පොදුවේ "මිනිසා" වගකිවයුතුය යන්නය.

උධෘත සියගණනක සම්පිණ්ඩනය සහ බහුලව සමාජගතව ඇති අර්ථ නිරූපණයෙන් තේමාවට ප්‍රවේශය ගනිමු.

"භූචලන, සුළි සුළං, ගංවතුර, සහ ලැව් ගිනි ආදිය මානව පාලනයෙන් ඔබ්බෙහි පවතින මුත් පරිසරයට බරපතළ විනාශයන් සිදුකරනුයේ මිනිසුන් ය" (මගේ අවධාරණය).

නමුත් පරිසර ව්‍යසනය පිළිබඳ සමකාලීන කතිකාව තුළ පොදු මිනිසාට කරනු ලබන මෙම චෝදනාව ඉස්මතුවන මුත් පරිසර දූෂණයට ඇත්ත වග කිව යුත්තන් එළිදරව් නො කරමින් සියලු පරිසර ව්‍යසනයක් ම 'මිනිසා' නැමැති සර්ව-ආවෘත (all-encompassing) පදයක දවටා ඉදිරිපත් කිරීම සාමාන්‍ය ලක්ෂණය වී ඇත. තවත් උදාහරණයක් ලෙස පහත උද්ධෘතය ට යොමු විය හැකිය.

"පරිසර විනාශයට හේතුව මිනිසාගේ ක්‍රියාකාරීත්වයයි" (*Environmental Change Conference* — Copenhagen, 2009) (මගේ අවධාරණය).

"මිනිසා විසින් ආයුධ, උපකරණ මෙන්ම ආහාර සහ ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය අඛණ්ඩව හඹා යෑම නිසා අප අපේ පැවැත්ම රඳා පවතින ජෛව පද්ධතිය විනාශකරනු ලබයි (මගේ අවධාරණය).

"ධනවාදී බටහිර රටවල් ද නිරන්තරයෙන් මෙය අවධාරණය කරයි." ජෝර්ජ් බුෂ් ද වරක් ප්‍රකාශ කළේ පරිසර අර්බුදයට මිනිසා වග කිව යුතු බවකි. පරිණාමී ජීව විද්‍යාඥයෙකු වූ Edward Wilson ද ඇඟිල්ල දිගු කරනුයේ (වියුක්ත) මිනිසෙකුටය. "වෙනත් කිසිම කාලයකට වඩා අද මිනිසා (මගේ අවධාරණය) විසින් පෘථිවියේ අවස්ථාපනීය කළ නොහැකි ලෙස, එනම්, හානි පූරණය කළ නොහැකි ලෙස සම්පත් පරිභෝජනය කර ඇති අතර ස්වභාවය වෙනස් කොට ඇත්තේ ද මේ මිනිසා විසිනි." (එඩ්වර්ඩ් විල්සන් පෙරවදන - J.D Sache (2008).

පරිසරය දූෂණය කිරීමේ සහ පරිසරය අර්බුදයට යැවීමේ චෝදනාවට මිනිසා වග කිව යුතුය යන අවිචාර පූර්වක දෘෂ්ටිවාදී ආස්ථානය සැබෑ පරිසර දූෂක ධනපති බොහෝ දෙනාගේ ජනප්‍රියතම පැහැදිලි කිරීම සහ ආවරණය වී ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ පරිසර අධිකාරිය ද අවධාරණය කරනුයේ මෙම ස්ථාවරයමය.

සැබෑ පරිසර දූෂක මිනිසාට වුවමනාවෙන්ම ආවරණයක් සපයමින් නැතහොත් ඔහුගේ සැබෑ භූමිකාව පිළිබඳව නො දන්නා කමින් පරිසර දූෂක සැබෑ කර්තෘ අඥාතයක් කොට පරිසර විනාශය කර්ම කාරක වාක්‍යයන් මඟින් ඉදිරිපත් කිරීමක් පරිසරය පිළිබඳ ශ්‍රී ලාංකික ලේඛනවල ද දක්නට ලැබේ. ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේත්, පරිසරය පිළිබඳ සමහර සඟරා වල පලවන ලිපිවලත් පොදු-මිනිසා ඉලක්ක කරගත් වාක්‍යයන් බහුලව දැකිය හැකිය.

"මිනිසාගේ ඍජු හෝ වක්‍ර ක්‍රියාකාරකම් හේතුවෙන් වායුගෝලයේ පැවතුන සංයුතියේ වෙනස්වීමත් සමඟ දේශගුණයේ විවිධ වෙනස්වීම් දක්නට හැකිවීම දේශගුණ විපර්යාසය ලෙස සරලව හැඳින්විය හැකිය" (මගේ අවධාරණය- *පරිසර පුවත්*).

*'දේශගුණ විපර්යාස සහ පරිසර විනාශය පිළිබඳ අවධාරණය මිනිසා වන අප විසින් සිදු කරන විවිධ ක්‍රියාකාරකම් පරිසර විනාශය සඳහා ඍජුවම බලපාන බව කවුරුත් පිළිගන්නා සත්‍යයකි.'* (මගේ අවධාරණය). ('දේශගුණික විපර්යාස සහ මිහිතලය උණුසුම් වීම', ශ්‍රී ලංකා මධ්‍යම පරිසර අධිකාරියේ වෙබ් අඩවිය). අප මිනිසුන් වන බව සත්‍යයකි. එහෙත් පාඨක ඔබත්, ලේඛක මමත්, තවත් කෝටි ගණනක මිනිසුනුත් පරිසර දූෂණයට වග කිව යුත්තෝද? සත්තකින්ම නැත. අප ඒ සඳහා වග කිව යුත්තන් නොව අප එහි ගොදුරුය. ඉන් දැඩි සේ පීඩා විඳින්නන්ය. එහි අගතියට පත් පාර්ශවයයි.

එපමණක් නොව, මිනිසා සහමුලින් ම සමීකරණයෙන් ඉවත් කොට පරිසර අර්බුදය පරිසරයට ම පටවමින් ලියැවුණු භාසෝත්පාදක වැකිද පරිසර සඟරා තුළ විටින් විට දැකිය හැකිය. පහත පළවනුයේ එයට උදාහරණයකි.

පසුගිය දශක කිහිපය තුළදී හරිතාගාර සාන්ද්‍රණය වැඩිවී ඇත. කාබන්ඩයොක්සයිඩ් , මීතේන්, හයිට්‍රස් ඔක්සයිඩ්, ක්ලෝරොෆ්ලෝරෝ කාබන් ආදිය වායුගෝලයට විසිරී යාමක් සිදුවේ."

ශාස්ත්‍රීය බරක් නැති මෙවැනි අනුභූතිවාදී නිරීක්ෂණයන් තුළින් ප්‍රකාශ වනුයේ සාන්ද්‍රණයින් ආකස්මිකව නැතිනම් කර්තෘ-රහිතව ඉබේම සිදුවන බවකි. එනම්, මෙයින්

සෘජුවත් වක්‍රවත් ගමායවනුයේ හරිතාගාර සාන්ද්‍රණයේ ප්‍රතිශතයේ වැඩිවීම නිසා ඇතිවන වායු ගෝල පෙරළිය පරිසරයේ ම ස්වයං-නිෂ්පාදනයක් බවකි. ඇත්ත. හරිතාගාර සාන්ද්‍රණයන් ස්වභාවික හේතු නිසා ද සිදුවේ. එහෙත් අද හරිතාගාර සාන්ද්‍රණයන් ගෝලය පුරාම බෙදාහරින ධනවාදී මිනිසා ගැන වචනයකුදු නො දොඩා හරිතාගාර සාන්ද්‍රණයන්ගේ වැඩිවීමේ වරද ස්වාභාවයට ම පැවරීම එක්කෝ පරිසරය පිළිබඳ නො දන්නා නිසා නැතිනම් පරිසර දූෂක ධනවාදීන් ආරක්ෂා කිරීමට ඇති උවමනාව නිසා ලියැවෙන්නෙකි.

ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යාංශයේ සහ පරිසර අධිකාරියේ පරිසරය නමැති තම විෂයය පිළිබඳව ඇති දැනුම මැනෙන තවත් එක උද්ධෘතයක් අවසාන වශයෙන් දක්වමි.

*'ගෝලීය උණුසුම ඉහළයාම පිළිබඳව මිනිසා වගකිවයුතු අතර මිනිසාගෙන් සෘජුවම සිදුවන හානියට අමතරව ගෝලීය උණුසුම ඉහළයාම නිසාද එම පද්ධති වලට තර්ජන එල්ල වී ඇත.'* (මගේ අවධාරණය).

අද ලෝකයේ ගෝලීය උණුසුම ඉහල යාමට වගකිවයුත්තන් වෙනම සිටිය දී ගෝලීය උණුසුම ගෝලයේ ස්වාධීන විපර්යාසයක් ලෙස හේතු දැක්වීම මොන තරම් බොළඳද? මෙයින් ඉහත උද්ධෘතයෙහි කතුවරයා කීමට උත්සාහ දරනුයේ "වියුක්ත මිනිසා" විසින් පමණක් නොව ගෝලීය උණුසුම ගෝලය විසින් ම ඉහළ යවා ගැනීම ද කරන බවකි. පරිසර අර්බුදය විසඳීම සඳහා මෙවැනි සරල සහ අපරිණත දැනුමක් කෙසේනම් ප්‍රයෝජනවත් වේදැයි යන ප්‍රශ්නය බුද්ධිමත් ඔබගේ සිතට පහළවීම වැළැක්විය නො හැකියැයි මට සිතේ.

ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ යෝජිත පහත *'දැක්මෙහි'* (vision) සහ *'මෙහෙවරෙහි'* (mission) සාධනීයත්වය නැතිනම් ධනාත්මක කාර්ය සංසිද්ධිය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සපුරා ගත හැක්කේ එවිට පමණි. නො එසේනම් ඒවා හුදු හිස් ප්‍රලාප සහ වාගාලංකාර (rhetoric) පමණක් වනු ඇත. මෙම නිගමනය නිවැරදි බව ස්ඵුට වනුයේ ශ්‍රී ලාංකික මධ්‍යම පරිසර අධිකාරයේ සහ අමාත්‍යාංශයේ 'දැක්ම' සහ *'මෙහෙවර'* ශ්‍රී ලංකාවේම ආනුභූතික දත්ත විසින් නිරන්තරයෙන් අභියෝගයට ලක්කෙරන හෙයිනි. ශ්‍රී ලංකාවේ පරිසර අධිකාරියේ *'දැක්ම'* සහ *'මෙහෙවර'* එම ගොඩනැගිල්ලට ඇතුල්වන ස්ථානයේ පුවරුවක මෙසේ ලියා ඇත.

දැක්ම (vision)-*"පරිසරයට සංවේදී ජාතියක් සහ ගෝලීය දේශගුණ විපර්යාසයට ඉහළ තලයකින් ප්‍රතිවර්තනයක් කළහැකි සමෘධිමත් ශ්‍රී ලංකාවක්."*

මෙහෙවර (mission)- *"උසස් සේවයක් හරහා පවිත්‍ර හරිත පරිසරයක්"*.

මෙහි දැක්ම සහ මෙහෙවර ඉතා උත්කෘෂ්ඨ වුවද ශ්‍රී ලංකාවාසීන්ගේ දෛනික අත්දැකීමට සාපේක්ෂව මධ්‍යම පරිසර අධිකාරියේ මෙම "දැකීම" මොන තරම් විඥාණවාදී ද? මොන තරම් සුව දායක සිහිනයක්ද? මොන තරම් නිසරු වාගාලංකාරයක්ද?

දිවා රෑ පාර තොටේ ශ්‍රී ලංකාවාසීන්ට දක්නට ලැබෙන කුණු කසල කඳු වලින්, නිරන්තරයෙන් ජනතාව මුහුණ දෙන පරිසර දූෂණයන්, ආසනික් සහිත ජලය, පොහොර භාවිතය නිසාවෙන් පසෙහි ස්වාභාවික සශ්‍රීකත්වය වඳවී යාම, කර්මාන්ත ශාලා වලින් නිකුත්වන අපද්‍රව්‍ය නිසා පරිසරයට වන හානිය, මිනිසුන් කරන උද්ඝෝෂණ, (ගම්පහ, රතුපස්වල සහ පිලියන්දල ජනතාවගේ), දේශපාලනයට සම්බන්ධ අය විසින් කැලෑ කපා වන ජීවිතය සහ පරිසරය විනාශ කිරීම, මධ්‍යම පරිසර අධිකාරියේ *'දැක්ම'* සහ *'මෙහෙවර'* වාගාලංකාරයනට සහ සිහිනයන්ට සීමා කරන බවට සජීවි උදාහරණයන් වෙයි. ලෝකයේ බොහොමයක් රටවල පරිසර අධිකාරයන් එළිදක්වනුයේද මෙම දැක්ම ම ය. එහෙත් කල් පවතින අයුරින් ජනතාවට හෝ පරිසරයට මෙම *'දැක්ම'* (vision) හෝ *'මෙහෙවර'* (mission) කළ යහපතක් නැත. එවැනි යහපතක් ඔවුනට කළ නො හැක්කේ එයට අවශ්‍ය *'දැක්ම'* වනුයේ ගස්-වැල්, සතා-සිව්පාවාගේ විනාශය ඇසින් දැකීම (seeing) නොව ජනතාව සහ පරිසරය පිළිබඳව හොඳ දේශපාලන දැකීමකි ( a political vision). එනම් පූර්ණ මානවවාදයකින් යුතු කල්පවතින දේශපාලන

දර්ශනයකි. Seeing නැමැති ක්‍රියාවලිය සාර්ථක පරිසර 'දැක්මකට' සහ 'මෙහෙවරකට' පරිවර්තනය කළ හැක්කේ එවිට පමණි. පරිසර දූෂණය නැවැත්වීමට නම්, පරිසර අර්බුදයෙන් බේරීමට නම් සහ පරිසර අර්බුදය විසඳීම සඳහා අවංක චේතනාවක් පරිසරකාමීන්ට ඇත්නම් කළයුත්තේ මිනිසා සහ පරිසරය අතර සම්බන්ධයේ සැබෑ ස්වභාවය සහ රූපය තේරුම් ගැනීමට පියවර ගැනීමය.එය කළ හැක්කේ පරිසරය, පරිසර දූෂණයට හේතුව, පරිසර අර්බුදයෙන් ගැලවීමට අවශ්‍ය මාර්ගය සහ ඒ මාර්ගය පිළිපැදීමට අවංක තීරණයන් ගන්නේ නම් පමණි. ලෝකයේ පරිසර විනාශයට සත්‍ය වශයෙන්ම වගකිවයුතු ධනපති පංතිය සහ අවස්ථාවාදී දේශපාලනඥයින් එම පාපයෙන් මුදවා අනුසීමා නො පැනවූ "වියුක්ත මිනිසකු" මත එම පාපය කවරෙකු හෝ පටවන්නේ නම් ඔහු හෝ ඇය ධනවාදීන් විසින් පරිසරය විනාශ කිරීම හා සමානම නැතහොත් එයටත් වඩා බරපතල අපරාධයක කොටස් කරුවන් වනු ඇත. මෙය කිසිසේත් ම සදාචාරාත්මක නොවේ. අනික් අතට පරිසර දූෂණයේ පාපය සහ ශාපය පොදුවේ කාටත් එල්ල වන විට පරිසර සම්පත් සියල්ලම තමන්ගේ වාසියට හරවාගනු ලබන ධනවාදීන්ට එය තම අරමුණු කිසිම බියකින් හෝ ලජ්ජාවකින් තොරව ඉටුකරගැනීම සඳහා දෙනු ලබන අවසරයක් සහ ආශිර්වාදයක් ද වේ. මුදලට සහ බලයට ගිජුව අප විසින් කරනු ලබන මානව විරෝධී සහ පරස්පර විරෝධී ක්‍රියාවන්ට අප වෙනුවෙන් සමස්ථ මානව වර්ගයා වෙත ඇඟිල්ල දිගු කිරීම 'අපේ භාග්‍යයක් ය' යන සිතිවිල්ලෙන් සැබෑ පරිසර දූෂක ධනවාදීන් උත්තේජනය නො වූයේ නම් පසුගිය දශකය තුළ ප්‍රාදේශීය, කලාප, හෝ ධ්‍රැවීය උෂ්ණත්වය නොව ගෝලීය උෂ්ණත්වයේ ප්‍රතිශතය 29% කින් වැඩිවිය හැක්කේ කෙසේද? තම වරද තමාගේම මානව-ජාතිවිශේෂයේ (homo-sapiens) සියල්ලන්ටම පවරන විට 'අපට මොනතරම් සතුටක් ද සහ ධෛර්යයක් දැයි' සැබෑ ධනපති පරිසර නාශකයින්ට නො සිතේයැයි කිව හැක්කේ කාටද?

පරිසර අර්බුදයට නිර්ව්‍යාජ විසඳුමක් සොයන්නෙකුට සහ අර්බුදයට සැබෑ වගකිවයුත්තන් කව්දැයි ජනතාවට හඳුන්වා දීම තම දේශපාලන වගකීම සහ සදාචාර අයිතිය ලෙස සලකන්නෙකුට පරිසර විනාශයෙහි වගඋත්තරකරුවන් ජනතාවට එළිදරව් කිරීම පැහැර හැරිය නොහැකිය. ධනවාදී දෘෂ්ටිවාදය විසින්ම ඇත ක්ෂතිජයකට යවා ඇති වුව ද සහ පරිසර අර්බුදය විසඳීම කෙතරම් දුෂ්කර වුව ද ඒ සඳහා පිළිපැදිය යුතු එකම දර්ශනය කාල් මාක්ස් පමණක් සතුව පවතින්නේ නම් ඒ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම යුගයේ අවශ්‍යතාවයයි. ගෝලීය මිනිස් ප්‍රජාව සමඟ ශ්‍රී ලාංකික ජනතාවත්, සමස්ථ මිහිතලයත්, මේ ශත වර්ෂය තුළ සිදුවෙතැයි විද්වතුන් පුරෝකථනය කර ඇති මහා විනාශයකින් බේරාගැනීමේ මානවීය වගකීම සහ ව්‍යාපෘතිය ඇත්තේ මාක්ස්ගේ පරිසර දර්ශනය තුළ පමණි[8].

### *කාල් මාක්ස්ගේ පරිසර දර්ශනය*

කාල් මාක්ස් විසින් පරිසරවේදය පිළිබඳ පලකල අදහස් බරපතළ ලෙස ගතයුත්තේ මේ හේතුව නිසාය. මාක්ස් පරිසරය පිළිබඳව සුවිශේෂ වශයෙන් ලියා නැතිවූවද ඔහුගේ සමස්ථ චින්තනයම පරිසරය තේරුම් ගැනීම සහ වෙනස් කිරීම සඳහා දිගහැරුණකි. පරිසරය යනු මිනිසාගෙන් පරිබාහිර යමක් නොව, මිනිසාද අඩංගු, මිනිසාද කැටුව දිගහැරුණු සහ වැඩුණු, මිනිසාගෙන් වෙන්කළ නොහැකි, එහෙත් අවශ්‍යතාවය මත මිනිසාට වෙනස් කළ හැකි, (මිනිසා ඉතිහාසය පුරා එසේ කළ නිසා සහ අදත් කරන නිසා), සත්‍ය වශයෙන්ම එම වෙනස් කිරීම මතම මිනිසාගේ ස්වභාවයේ හැඩය වුවද වෙනස් කර ගත හැකි එකක් සහිත යමක් බව පරිසර අධ්‍යයන ඉතිහාසයේ සහ කතිකාවේ පළමුවරට අවධාරණය කළේ කාල් මාක්ස්ය. අද ධනවාදය විසින් පරිසරය පිළිබඳව මතුකර ඇති බරපතළ ගැටළු මෙසේ ඇතිවන බව කල්තියා, එනම්, 19 වෙනි ශතවර්ෂයේ මැද භාගයේදී, පුරෝකථනය කරමින් පරිසරය පිළිබඳව තීක්ෂණ, ප්‍රශස්ථ, නිර්ව්‍යාජ

[8] *දාහත් වෙනි ශතවර්ෂයේ විසූ ප්‍රංශ දාර්ශනික රෙනේ ඩෙකාට්ස් ද තම Meditations සහ Discourse on Method යන කෘතීන් වලින් මිනිසා සහ ස්වභාවය පිළිබඳව සාකච්ඡා කොට තිබූ බව සත්‍යයක් මුත් ප්ලේකනොව් (Plekhanov) නිවැරදිව දක්වන පරිදි දර්ශනයේ ප්‍රධාන කාර්යය ලෙස ඩෙකාට්ස් ඔසවා තැබුයේ "පැරණි සංකල්ප නව සංකල්ප මගින් ප්‍රතිස්ථාපනය කරමින් ස්වභාවය මතට මිනිසා යොදන බලය වැඩිකළ යුතුය'',යන්නය. මාක්ස් පුළුල් මානවවාදයකින් සන්නධව තම EPM 1844 කෘතියෙන් අවධාරණය කළේ 'මිනිසා ස්වභාවයෙන් යැපෙන අතරම නිෂ්පාදනයේ සමාජ බලවේග වඩා දියුණු තත්ත්වයට පත් කරගැනීමට මිනිසා උත්සාහ කළයුතු බවය. The German Ideology, The Communist Manifesto සහ Capital ආදී කෘතීන් වලින් මාක්ස් විසින් තම ආස්ථානය වඩාත් පැහැදිලි කරන ලදී.*

දර්ශනයක් සූත්‍රගත කළේද මාක්ස්ය. අපගේ ශක්ති ක්ෂයවූ, හණමිටි දෘෂ්ටිවාද වලින්, අවස්ථාවාදී දේශපාලන චර්යාවන්ගෙන් සහ හිතුවක්කාර අස්ථානයන්ගෙන්, මිදී අද අප මුහුණ දෙන පරිසර අර්බුදයෙන් ගැලවීමට ඒ පිළිබඳව නිවැරදි රෝග විනිශ්චයක් සහ විසඳුමක් ඉදිරිපත් කළ මාක්ස්ගේ පරිසර දර්ශනය හැදෑරීමේ අවශ්‍යතාවය මතුවනුයේ මේ නිසාය.

කාල් මාක්ස් ගේ අදහස් ආර්ථික, දේශපාලන, සමාජයීය අධ්‍යනයන්ට අතිරේකව ආගම, විද්‍යාව, පුරාවිද්‍යාව, සමාජ විද්‍යාව, මානව විද්‍යාව, ඉතිහාසය, කලාව සහ සෞන්දර්ය සහ දර්ශනය යන විෂය ක්ෂේත්‍රයන්ට ඇතුළත්ව අද වන විට එම ක්ෂේත්‍රයන්හි තිබූ විවිධ සාම්ප්‍රදායික තත්වාවරක්ෂක මතවාද සහ විධික්‍රම පරිපථයට සේන්දු කිරීමට සමත්ව ඇතැයි දැකීම අපගේ භ්‍රාන්තියක් නොව 21වෙනි ශත වර්ෂයෙහි අප අත් දකින ආනුභූතික සංසිද්ධියකි, සත්‍යයකි. විසි වන ශත වර්ෂයේ මුල් භාගයේදී ඔහුගේ අදහස් පෙර’පර දෙදිග ම ව්‍යාප්ත වුයේ සමාජය වෙනස් කිරීම සඳහා අවශ්‍ය ශක්‍යතාවයකින් සන්නද්ධ චින්තනයක් ඔහු සතුව තිබූ හෙයිනි. මාක්ස්ගේ චින්තනය එදා මෙදා තුර වැළඳගෙන ඔහුගේ විශාල අනුගාමිකයින් රාශියක් ක්‍රියාකාරී දේශපාලනයක නිරතව ඇති මුත්, අද බොහෝ අය ගර්හිත අර්ථයකින් (pejorative sense) මාක්ස්ව හඳුන්වනුයේ *‘දඩබ්බර විප්ලවකාරයෙකු’* (වැන් බ්‍රන්ට් 1988), ‘විවෘත-සමාජයේ හතුරෙකු’ (කාල් පොපර් 1945), *‘කලාව සහ සාහිත්‍යය ආදිය ගැන නො තැකුවෙකු’*[9] සහ ධනවාදී අර්ථක්‍රමය සුණුවිසුණු කිරීම සඳහා පමණක් පෙරමුණු ගත් *‘වෙඩික්කාරයකු’*, *‘කසකරුවකු’* සහ *‘සමාජ පෙරළිකාරයෙකු’* මිස මිනිසා පිළිබඳව හෝ මිනිසා ජීවත්වන පරිසරය, එනම්, ගහකොළ, සතා-සිව්පාවා, ජලය, වාතය ආදිය සිය විග්‍රහයෙන් පිටමං කළ කයෝර්, ග්‍රාම්‍ය භෞතිකවාදියෙක් ලෙසය. ඉහත ගර්හිත විශේෂණ බලන්නාගේ කෝණයෙන් භාවාත්මකව මතුකරගන්නා විශේෂණ නිසා ඒවා අප අපේ ඇස් මානයේ මායිම් නොකරමු. එහෙත් මෙම විචාරකයින් අවධාරණය කරන මුල් කරුණ එනම් *“මාක්ස් ධනවාදය පෙරළා දැමීම සඳහා පෙරමුණ ගත් පළමු වෙඩික්කාරයා සහ කසකරුවා”* යන හඳුනාගැනීම නම් සම්පූර්ණ සත්‍යයකි. කෙසේ වුවද මොවුන් පළකරන දෙවැන්න, එනම්, *“මාක්ස් මිනිසා සහ පරිසරය ගැන නො සළකා හැරියේය”* යන්න නම් සම්පූර්ණ අසත්‍යයකි. කාල් මාක්ස් තරම් මිනිසා සහ පරිසරය පිළිබඳව ගැඹුරු විප්ලවකාරී දේශපාලනික කියවීමක් කළ වෙනත් චින්තකයෙකු මාක්ස්ට පෙරත් මාක්ස්ට පසුවත් නො සිටියා පමණක් නොව අද ද නො සිටී.

කාල් මාක්ස් නැමැති භෞතිකවාදියාගේ විප්ලවීය අදහස් ආර්ථික, දේශපාලන, ඉතිහාසය සහ සමාජය ආදී ක්ෂේත්‍රයන් මත පතිතව එම ක්ෂේත්‍රයන්හි අධෝ ව්‍යුහයන් මෙන්ම උපරිව්‍යුහයන්ද පුපුරුවා හැරි බව ප්‍රචලිත කරුණකි. එහෙත් ඔහුගේ මෙම චින්තනය තුළම ඔහු ස්වාභාවික පරිසරය එහි ව්‍යසනය සහ ඒවාට බලපෑ හේතු පිළිබඳව අදහස් පළ කළ බව බටහිර රටවල වුවද දන්නේ නම් ඒ ස්වල්ප දෙනෙකි. ශ්‍රී ලංකාවේ නම් කාල් මාක්ස්ගේ චින්තනය තුළ පරිසරය පිළිබඳ න්‍යායක් තිබූ බව පරිසර අමාත්‍යංශය, මධ්‍යම පරිසර අධිකාරිය හෝ පරිසරය ගැන උනන්දු වන්නන් එක් අයෙකු හෝ දන්නේදැයි සැකයක් මතුවනුයේ ඔවුන්ගේ ලිපි ලේඛන වලින් ඒ පිළිබඳව හෝඩුවාවක් හෝ දිස් නොවන හෙයිනි. මාක්ස් ගැන හැදෑරූ බොහෝ ලෝක ප්‍රසිද්ධ විද්වතුන් පවා මිනිසා සහ පරිසරය පිළිබඳව මාක්ස් නො සැලකුවේයැයි මිථ්‍යාවක් වපුරා ඇත. මේ අය අතුරින් කැපී පෙනෙන්නෙකු වනුයේ ලෙසෙක් කොලොකොව්ස්කි ය. ඔහු මෙසේ ලීවේය.

*“ස්වාභාවය හෝ පරිසරය ගැන තැකීමක් මාක්ස් තුළ නොවීය. මිනිසාගේ ස්වාභාවික පැවැත්ම පිළිබඳ ඔහුගේ දැනුම හීනය. ඔහු මිනිසා නිර්වචනය කර ඇත්තේ සමාජ පද*

*9* *මෙය සහමුලින්ම දෝෂ සහිතය. කලාව සහ සාහිත්‍ය පිළිබඳව මාක්ස් දැරූ අදහස් පිළිබඳව අපමණ කෘතීන් පළවී ඇත. ඉන් වැදගත් සමහරක් නම් (ප්‍රෝවර් 1976; බලන්න. ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි 2008; ඩෙස්මන්ඩ් මල්ලිකාරච්චි 2003, මාග්‍රට් රෝස්:1984). එපමණක් නොව මාක්ස් සදාචාර-විරෝධියෙකුද වූ බව (රැල්ෆ් බුල්ජන්ස් 1982) සහ මාක්ස් ප්‍රචණ්ඩත්වයට පාර කැපූ හිංසාකාරී කොමියුනිස්ට්ස්කාරයෙකු ලෙස ද හඳුන්වා ඇත. ශ්‍රී ලාංකික මාධ්‍ය වේදියෙකු වූ වික්ටර් අයිවන් (රාවය 2008). සත්තකින්ම ප්‍රචණ්ඩ වනුයේත්, හිංසාකාරී වනුයේත්, මානව සහ ඥාණ-විරෝධී වනුයේත්, අශිෂ්ට වනුයේත් යමෙකු ගේ අදහස් අධ්‍යයනය නො කොට මෙවන් නිගමන වලට එළඹෙන්නවුන් මිස අදහස්වල නිර්මාතෘවරුන් නොවේ.*

*වලින් පමණි. මිනිසාගේ පැවැත්මේ භෞතික පදනම් ඔහුගේ අවධානයෙන් ගිලිහී ගොස් තිබිණ"*(කොලොකොව්ස්කි:1976).

කොලොකොව්ස්කි තරම් සංයුක්ත සහ සෘජුව පළ නොකළද මහාචාර්ය ඇන්තනී ගිඩන්ස් මෙවැනි අදහසකට සමීප වූ බවක් පෙනේ.

*"පංති සමාජයක සූරාකෑමට භාජනයව ඇති මානව සම්බන්ධතා වෙනස් කිරීම සඳහා මාක්ස්ගේ උනන්දුව ස්වාභාවයේ සූරාකෑම කෙරෙහි ඒ ආකාරයෙන්ම භාවිතව නැත..."*

( ඇන්තනී ගිඩන්ස්:1981 ).

කාල් මාක්ස් පරිසරය පිළිබඳව නොසළකා හැරි නිසා මාක්ස්වාදය සහ පරිසරය අතර සබඳතාවක් දක්නට නැතැයි අවධාරණය කර ඇත්තේ මොවුන් පමණක් නොවේ. ස්ත්‍රීවාදී පරිසරවාදියෙකු වන කැරලීන් මර්චන්ට් පවසනුයේ *"මාක්ස් සහ එංගල්ස් යන දෙදෙනාම ධනවාදයේ පරිසරාත්මක පිරිවැය (environmental cost of capitalism) පිළිබඳ ව හොඳ වැටහීමකින් සිටිය මුත් පරිසරය යටත් කරගැනීමේ 'බුද්ධි ප්‍රබෝධ මිථ්‍යාව' පිළිබඳව ඔවුන් සිටියේ දෙගිඩියාවකය,''* යන්නය. (කැරලීන් මර්චන්ට් :1994). ටෙඩ් බෙන්ටන් අවධාරණය කොට තිබුනේ කාල් මාක්ස්ගේ චින්තනය මානව කේන්ද්‍රීය වූ නිසාම ආර්ථික දියුණුවක් හඳුනා ගනු ලබන ඕනෑම රාමුවකට ඔහු තදින් විරෝධය පෑ බවය. (ටෙඩ් බෙන්ටන්: 1989).

මාක්ස් තුළ පරිසර දර්ශනයක් නො තිබිණි ය යන්නට විවිධ කෝණ වලින් ඉදිරිපත් කළ අදහස් රාශියක් මේ මෑතදී පළවූ මුත් අවසාන වශයෙන් පශ්චාත් නූතනවාදී පරිසරවාදියෙකු වූ වෙඩ් සිකෝස්කි දැරුවේ *"මාක්ස් යන්ත්‍රය පිළිබඳව අපේ යුගයේ භක්තිමත්ම වන්දනා කරුවෙකු"* වූ බවය. *"මානව සමාජය තුළ යන්ත්‍රය සකලාංග සම්පූර්ණ කිරීමට ධනවාදය උත්සාහ කළ නිසා ධනවාදයෙන් කුමක් හෝ පවක් සිදුවූයේ නම් එයට ක්ෂමා කළ යුතු බවක්''* ද ඔහු කියයි. මෙයද වැරදි නිරීක්ෂණයක් වනුයේ මාක්ස් කිසිදා යන්ත්‍රය නැමැති භාණ්ඩයට අර්චණකාම රුචියක් (fetishist) තිබූවෙකු නොවූ බැවිනි. මිනිසාගේ ඥාණයේ වර්ධනයට සහ පරිසරය සමඟ මිනිසා කරනු ලබන ගණුදෙනුවේදී ඉන් උපරිම ප්‍රයෝජනය ලැබීමේ කර්තව්‍යයේදී යන්ත්‍රයේ භූමිකාව ඉතා වැදගත් වන බව මාක්ස් අවධාරණය කර තිබිණ. මාක්ස් විරුද්ධ වූයේ යන්ත්‍රයට නොව එහි හිමිකාර යන්ත්‍රය හරහා කම්කරුවා සූරාකන කෑදර ධනපතියාටය. මාක්ස් සම්බන්ධයෙන් ව්‍යාප්ත කොට ඇති මෙම සියළු මිථ්‍යාවන්ගෙන් පැහැදිළි වනුයේ පරිසරය සහ මිනිසා පිළිබඳව මාක්ස්ගේ චින්තනය මේ කිසිවෙකු අවශ්‍ය ශික්ෂණයකින් හදාරා නොමැති බවයි.

ශාක සහ සත්ත්ව පරිසරය පිළිබඳව මාක්ස් කථා නො කළේ යැයි ප්‍රකාශ කරන මොවුන් සියල්ලන්ම එසේ කරනුයේ පරිසරය යනු සූරාකෑම සඳහාත් තමන්ගේ සුඛවිහරණය පිණිසත් පවතින බාහිර වස්තුවක් ය යන ධනවාදීන්ගේ සහ අධිරාජ්‍යවාදීන්ගේ සීමිත (limited) සහ පංති (class) නිර්වචනය මාක්ස්ගේ පරිසරය පිළිබඳ චින්තනය තුළ යම් හෙයකින් අඩංගු නො මැති නිසා නම් එය එලෙසින්ම පිළිගත යුතු සත්‍යයකි. හේතුව, නූතන ධනවාදී පරිසර විද්‍යාව (ecology) නිර්වචනය සහ සංකල්පය තුළ නම් මාක්ස් හෝ එංගල්ස් සත්තකින්ම නොමැතිවීමයි. මාක්ස්ගේ පරිසර දර්ශනයේ විශේෂත්වය නම් එය ස්වභාවික ගණයේ විද්‍යාවක් නොව මිනිසා සහිතව අවබෝධ කර ගතයුතු න්‍යාය හරිත (theory impregnated) සුභාවිතයක් (praxis) වීමයි. මෙයට ද හේතුව මාක්ස්ගේ පරිසර දර්ශනය ධනේශ්වර අර්ථයෙන් පරිසර විද්‍යාවක් (Science of Environment) නො වීමයි[10]. මාක්ස්ගේ පරිසර දර්ශනය මිනිසාගෙන් ඈත්වූ ගහකොළ සතා සිව්පාවා හෝ ඇළ දොළ හෝ ඒවායේ විනාශය පිළිබඳ මැසිවිලි රචනාවක් හෝ අඳෝනාවක් හෝ ඒවායේ සංරක්ෂණය පිළිබඳ සර්ව ශුභවාදී යථානුභූතවාදී විද්‍යාවක් (optimistic & positivistic science) නොවේ. එය පරිසරය සූක්ෂම ලෙස සූරාකෑම පිළිබඳව ශූර ශිල්පීය ක්‍රමයක් ද නොවේ. එය පරිසරයට මානවවාදී මුහුණුවරක් තිරසාර වශයෙන්ම ප්‍රදානය කිරීමට කැපවූ සහ ඒ උදෙසා කටයුතු කළ යුතුයැයි අනු දකින මානවවාදී සංකල්පයන්ගෙන් සංයුක්ත සුභාවිත පරිසර දර්ශනයකි.

*10. පා සටහන අංක 5 බලන්න.*

**පරිසර අර්බුදයට යෝජිත විසඳුම්**

පරිසර සුරැකිමේ සහ පරිසර අර්බුදයට විසඳුම් සොයන සංවිධාන රාශියක් විවිධ නම් යටතේ ලෝකය පුරා ක්‍රියාත්මක වේ.[11] *'රාජ්‍ය නො වන සංවිධානයන්'* ද (NGO) දහස් ගණනින්[12] පරිසර අර්බුදයට පිළියම් යෝජනා කරන අතරතුර විවිධාකාර ව්‍යාපෘති හඳුන්වා දෙමින් ඒවාද පරිසර විනාශය වැළැක්වීමට කටයුතු කරයි. එපමණක් නොව, ලතින් ඇමෙරිකානු, ස්කැන්ඩිනේවියානු, යුරෝපා සහ ආසියානු රටවල් ද සංවිධාන සහ පදනම් සිය ගණනින් පිහිටුවා ගනිමින් පරිසර අර්බුදයට පිළියම් සොයයි.1992 දී බ්‍රසීලයේ රියෝ ද ජැනයිරෝ, 2002 දී දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග්, සහ 2012 නැවත රියෝ ද ජැනයිරෝ යන නගරයන්හි (Rio-20) සහ ලෝකයේ වෙනත් නගරයන්හි "හරිත ආර්ථිකයක්" (green economy) ගොඩනැගීම සඳහා මහා පරිමාණයේ සාකච්ඡා වට ගණනාවක් පවත්වා ඇත. එහෙත් මේ සියළු ක්‍රියාකාරකමක්ම නිශ්ඵල ව්‍යායාමයන්ව ඇත්තේ පරිසරයේ වර්තමාන අර්බුදයට වගකිවයුතු ධනවාදී රටවල්ම මෙම සංවිධානයන්ගේ මුල් පුටු හොබවන හෙයිනි. පරිසර අර්බුදයේ මූලාශ්‍රය සහ අර්බුදයේ හේතුකාරකය වන ධනපති ආර්ථික රාමුව තුළම හිඳිමින් ධනවාදයට හුරු පුරුදු ශික්ෂණ භාෂාවෙන් යෝජනා සහ අණ පනත් ඉදිරිපත් කිරීම නිසාවෙනි. ධනවාදී ආකෘතිය රකිමින් පරිසරය සුරැකීම කළ නොහැකිය. පරිසරය ආරක්ෂා කර ගනිමින් මිනිසාද මෙම විනාශයෙන් ගලවා ගත හැක්කේ කාල් මාක්ස් යෝජනා කළ පරිදි ධනවාදී ආකෘතිය සහමුලින්ම උගුළුවා දැමීමෙනි. 18 වෙනි සහ 19 වෙනි ශත වර්ෂවල සිට ලෝකයේ හරිත රටාව විනාශ කළ ධනවාදය ම හරිත-ආර්ථිකයක් නැවත ගොඩනැඟීමට උත්සාහ කිරීම උත්ප්‍රාසයකි, හාස්‍යෝත්පාදක නාඩගමකි. පරිසර අර්බුදය අවම කිරීමට කරනු ලබන සියළුම යෝජනා සහ ප්‍රායෝගික වැඩපිළිවෙළවල් සහ වැඩමුළු විශේෂයෙන් *'හරිත ආර්ථිකය'* නමැති සංකල්පය පිළිබඳව මාක්ස්වාදී කෝණයෙන් නො වුවද සමහරුන් මතුකරන සැකය, එනම්, *'කොතෙක් දුරට හරිත ආර්ථිකය'* නැමැති සංකල්පය මෙම මිහිතලය මත ප්‍රායෝගික යථාර්ථයක් බවට පත්වේද? *'හරිත ආර්ථික සංකල්පය ජනප්‍රිය තේමාවක් පමණක්ද?'* (පරිසර පුවත්) වැනි ප්‍රශ්න සාධාරණ සහ අර්ථසම්පන්න වනුයේ හරිත ආර්ථික සංකල්පයට වඩා ධනවාදය සහ අධිරාජ්‍යවාදය දේශපාලනික වශයෙන් බලවත් හෙයිනි. ලෝකයේ හරිත රටාවේ සියළු පැතිකඩක්ම 18 සහ 19 වෙනි ශත වර්ෂවල සිට විනාශ කළ සහ පරිසරය දූෂණය කළ ධනවාදීන් (මාක්ස්:1844) Engels:1872-3) තම අරමුණු වලට හානියක් නොවන පරිදි ජෛව පද්ධතිය බේරාගැනීම සඳහා කටයුතු කරනු ඇතැයි යන්න විශ්වාස කළ නොහැකි නිසාය.

ශ්‍රී ලංකාව ද පරිසරය සුරැකීම පිළිබඳවත්, පරිසර අර්බුදය අවම කරගැනීම සඳහාත්, විවිධ උපක්‍රම යෝජනා අණ පණත් ප්‍රතිපත්ති වැඩමුළු සම්මන්ත්‍රණ ආදිය පරිසර අමාත්‍යංශය, මධ්‍යම පරිසර අධිකාරිය, රාජ්‍ය නොවන සංවිධාන සහ ආගමික සංවිධාන මූලිකත්වයෙන් පැවැත්වෙන බව සත්‍යයකි. පරිසර නියමු ජාතික කඳවුරු, ජාතික හරිත සම්මාන වැඩ සටහන් මාලා, පරිසර දූෂණ පාලන ඒකකය, පරිසර අධ්‍යාපන වැඩ සටහන් *'පරිසර පුවත්'* ඇතුළු විවිධ සඟරා මුද්‍රණය කිරිම ආදී වශයෙන් විශාල කාර්ය භාරයක් විශේෂයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ඉටු කරනු ලැබේ.

කෙසේවුවද, මෙම යෝජනා, ප්‍රතිපත්ති රෙගුලාසි සහ වැඩපිළිවෙළවල් මඟින් පරිසර දූෂණය සමහර විට අවම කළ හැකි වුවද පරිසර අර්බුදයට තිරසාර පිළියම් මේවා තුළ දක්නට නැත. ඒ සඳහා අවශ්‍ය දැක්ම හෝ දර්ශනය මේවා තුළ අන්තර්ගත වී නැත. එපමණක් නොව දිගු කාලීන විසඳුමක

***11.*** *පරිසර අර්බුදය විසඳීම සඳහා ඉදිරිපත්ව ඇති රාජ්‍ය නො වන සංවිධානයන් දහස් ගණනකින් ප්‍රධාන කිහිපයක් මෙම ලිපියේ තර්කය සජීවී කිරීම සඳහා පහත දක්වා ඇත. Antinea Foundation, Bio-fuel Watch, Climate Justice Now, Friends of the Earth, Green Cross International, European Environmental Agency, Earth Watch සහ Friends of Nature ආදියයි.*

***12 .*** *පරිසරය අර්බුදයට පිළියම් සොයා යන විවිධ ආයතන සහ සංවිධාන දහස් ගණනින් ප්‍රධාන අතලොස්සක නම් කිහිපයක් මෙසේය. Earth System Governance Project (ESGP) , Global Environmental Facility (GEF), Intergovernmental Panel on Climate Change (IPCC), United Nations' Environmental Programme, World Nature Organization සහ World Wide Fund of Nature ආදියයි.*

යෝජනාවක සේයාවක්වත් මේවා තුළ හෝ ඉහත දැක්වූ ජගත් පරිසර සංවිධානයන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති තුළ හෝ දක්නට නැත. මෙම නිගමනයට පැමිණීමට ප්‍රධාන හේතුව මේ සියල්ල ක්‍රියාත්මක වුවද ඒවාට වඩා වැඩි වේගයකින් සහ ධාරිතාවයකින් පරිසර විනාශය අදත් සිදුවීමයි.

*"19 වෙනි ශත වර්ෂයේදී බ්‍රිතාන්‍ය කෘෂිකර්මයට කිසිම බුද්ධිමත් හෝ තාර්කික පදනමක් නොතිබිණි"* (Liebig:1824). Liebigගේ ඉහත නිරීක්‍ෂණයෙන් බලපෑම් ලැබූ මාක්ස් එයට වසර විස්සකට පසු *"ධනවාදයට එරෙහිව මානවවාදය"* නමැති සිය ව්‍යාපෘතියෙන් ලත් න්‍යායාත්මක පන්නරය (මාක්ස්: *EPM 1844* ) තවදුරටත් මුවහත් කරමින් මාක්ස් තම *Capital* (වෙළුම1) හි නූතන කාර්මික කෘෂිකර්මයේ විනාශකාරී අංශයන් පිළිබඳව අවධාරණයකින් සහ භාව ප්‍රකෝපයකින් යුතුව ධනවාදයට චෝදනා කරයි. කෘෂිකර්මය යනු පරිසරය සමඟ මිනිසාගේ අත්‍යන්ත සම්බන්ධයේ සාක්ෂිය මෙන්ම කැඩපතද වන නිසා මාක්ස් ධනවාදී කෘෂිකර්මය විවේචනය කිරීම ම යනු පරිසරය වෙනුවෙන් පෙනී සිටීමකි. පරිසරය සහ මිනිසා වෙනුවෙන් මාක්ස් කරනු ලැබූ අවධාරණයන් අතර පහත කරුණු ප්‍රධානවේ.

1. මිනිසා සහ පරිසරය (නැතිනම් මිනිසා සහ පෘථිවිය අතර) තිබූ පාරිවෘත්තික සම්බන්ධය නැතිනම් මිත්‍රත්වය ධනවාදය විසින් නැවත පිළියම් කළ නොහැකි ආකාරයට දෙකඩ කරන ලදි (metabolic -rift)[13].
2. එසේම ධනවාදය යටතේ වර්ධනය වන මහා පරිමාණ කෘෂිකර්ම ව්‍යාපෘතීන් සහ දිගු-දුර වෙළඳාම (distance-trade) විසින් මෙම පාරිවෘත්තික දෙකඩත්වය තීව්‍ර කරනු ලැබීය.
3. එංගලන්තයේ 19වෙනි ශතවර්ෂයේ නගරයන් දෙස බලන කල පාංශු පෝෂ්‍ය පදාර්ථයන්ගේ නාස්තියත් පරිසර දූෂණයත් පැහැදිලිව දක්නට ලැබේ. ලන්ඩන්හි මිලියන 4 ක පමණ මනුෂ්‍යයින්ගේ බහිස්‍රාවයන් (excretions ) තේම්ස් ගඟට මුදාහැරීමට සැලැස්වීම මෙයට හොඳ උදාහරණයකි[14].
4. මහා පරිමාණ කර්මාන්ත ශාලා සහ මහා පරිමාණ යාන්ත්‍රික කෘෂිකර්ම ව්‍යපෘතින් පරිසර විනාශකාරි ක්‍රියාවලියේ නියුක්ත වෙමින් කාර්මික-වාණිජ ධනවාදය කරනුයේ පාංශුවල ගුණය අංශු මාත්‍රයක් හෝ නො තබා ක්‍ෂය කිරීම සහ ඒවායේ පෝෂණ ගුණය නැතිනම් සශ්‍රීකත්වය සූරාකෑමය.
5. මේ සියල්ලෙන්ම ප්‍රකාශ වනුයේ ධනවාදය යටතේ කාර්මික-නගරය සහ පාරිසරික-ගම අතර ඉදිවන ප්‍රතිවිරෝධක සම්බන්ධයයි (antagonistic relations).
6. ධනවාදී ක්‍රමය තුළ තාර්කික සහ බුද්ධිමත් කෘෂිකර්මයට ඉඩ ප්‍රස්ථාවක් නොලැබේ. ඉඩ ලැබෙනුයේ සහ ධනවාදය ඉඩ දෙනුයේ කුමන ක්‍රමයකින් හෝ වාණිජ ප්‍රතිලාභ සමුච්චනයකට මඟ පෑදීමකට පමණි.
7. මිනිසුන් සහ පරිසරය අතර සමාජ නිෂ්පාදනයේ නියාමක රීතිය නැවත ඇතිකර ගැනිම අත්‍යාවශ්‍ය වනුයේත්, ධනවාදය අභිබවා යමින් මිනිස් ප්‍රජාව සහ පෘථිවිය අතර පාරිවෘත්තික සම්බන්ධතාවය බුද්ධිමත් ලෙස නැවත විධිමත් කිරීමේ වැඩපිළිවෙලක් සමාජවාදී - කොමියුනිස්ට්වාදයක් හරහා ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය මතුවනුයේත් මෙහෙයිනි. (Marx *Capital 1* සහ *Capital 3* ).

පරිසර විනාශයට ප්‍රධාන හේතුව ධනවාදීන් විසින් මිනිසා සහ පරිසරය අතර පැවති මෙම අන්‍යෝන්‍ය සම්බන්ධය කැඩීම යැයි බෙලාමි

*13 Metabolic Rift යනු මිනිසා සහ පරිසරය අතර චිරාත් කාලයක් පැවති සමීප සම්බන්ධය ධනවාදය විසින් කඩා බිඳ දැමීමේ ක්‍රියාවලිය හැඳින්වීමට මහාචාර්ය ජෝන් බෙලාමි ෆොස්ටර් ප්‍රමුඛ න්‍යායාචාරීන් විසින් භාවිතා කොට පරිසර අධ්‍යයන කතිකාවට මෑතදී එකතු කළ සංකල්පයක් සහ වාක්‍ය ඛන්ඩයකි. (බලන්න. ෆොස්ටර්:1999).*

*14 ලන්ඩනයේ කර්මාන්තශාලා විසින් මුහුදට මුදා හරින අපද්‍රව්‍ය නිසා එම නගරය මුහුණ දෙන ප්‍රශ්නය පිළිබඳව එන්ගල්ස් ද අවධාරණය කර ඇත. (බලන්න. එන්ගල්ස් : 1872-1873/1942/1975).*

ෆොස්ටර් ශාස්ත්‍රීය කරලියට ගෙනෙනුයේ කාල් මාක්ස් 19 වෙනි ශත වර්ෂයේ මැද භාගයේදී මෙම රෝග විනිශ්වය කර තිබුණු නිසාවෙනි. *Economic and Philosophical Manuscripts-1844* කෘතියෙන් මාක්ස් විසින් අවධාරණය කරන ලද මෙම පාරිවෘතික සම්බන්ධයේදී මිනිස් ශ්‍රමය පිළිබඳව සපයන ලද නිර්වචනය පසුව ඔහු *Capital* පළමු වෙලුමේදී ද මෙසේ ප්‍රතිඅවධාරණය කර ඇත. *"මිනිස් ශ්‍රම ක්‍රියාවලිය වනාහි මිනිසා සහ පරිසරය අතර පාරිවෘත්තික අන්තර් ක්‍රියාකාරීත්වයේ විශ්වීය කොන්දේසියයි. මානව පැවැත්මේ සදාතන ස්වාභාවාරෝපිත ප්‍රත්‍යයයි (nature-imposed condition )* "(මාක්ස් *Capital* 1). මාක්ස්ට අනුව ස්වභාවය (nature) යනු මිනිසා සහ පරිසරය අතර එදා සිට පැවැති මෙම පාරිවෘත්තිමය සම්බන්ධයයි. මාක්ස් ගේ *Economic and Philosophical Manuscripts* නැමැති සමස්ථ කෘතියම කැපවූයේ මෙය පැහැදිළි කිරීමටත් ධනවාදීන්ගෙන් මෙම පාරිවෘත්තිය මුදවා ගෙන නැවත එය මිනිසාට ලබා දීමේ වැඩ පිළිවෙලක් සඳහාත්ය. මාක්ස් සහ එංගල්ස් විසින් රචිත *The Communist Manifesto* කෘතිය මෙම අරමුණ ශාක්ෂාත් කරගැනීම පිණිස ජනතාවට ඉදිරිපත් කරනු ලැබූ වැඩපිළිවෙලයි. මාක්ස්ගේ පරිසර දර්ශනය ඔහුගේ මානව වාදය සහ ඔහුගේ විප්ලවීය දේශපාලනය යන ත්‍රිත්වය එකට හමුවීමේ ලක්ෂය මෙයයි. ඔහුගේ *Capital* 1, 2, සහ 3 පරිසරය සහ මිනිසා ධනවාදීන්ගෙන් බේරාගැනීමේ අවශ්‍යතාවය තවදුරටත් පැහැදිලි කිරීම සඳහා ධනවාදයේ නාභිය වන ප්‍රාග්ධනයේ සත්‍ය භූමිකාව විග්‍රහ කිරීමට පෙළඹුනේ මේ හෙයිනි. පරිසරයත් මිනිසාත් ව්‍යසනයෙන් බේරාගත හැක්කේ දූරදර්ශී දේශපාලන වැඩපිළිවෙළකින් පමණි. මාක්ස්ගේ සහ එංගල්ස් ගේ *The Communist Manifesto* (1948) එකවරම ධනවාදී සමාජය වෙනස් කිරීමේ දේශපාලන විප්ලවකාරී වැඩපිළිවෙලක් මෙන්ම පරිසරය බේරාගැනීමේ ව්‍යාපෘතියක් ද වනුයේ මෙහෙයිනි.

**හේගල්ගේ සහ ලූඩ්විග් ෆියුබා ගේ ස්වාභාවය පිළිබඳ දර්ශනයන්ට මාක්ස්ගේ ප්‍රතිචාරය**

හේගල්ගේ ස්වාභාවය පිළිබඳ දර්ශනයටත්, ඒ පිළිබඳව ලූඩ්විග් ෆියුබා ගේ විචාරයටත් මාක්ස් දැඩි ලෙස විරුද්ධ වූයේ හේගල් 'ශුද්ධ අදහසක්' (pure idea) නැමැති නිගමනයකට එළඹ දෙවනුව පමණක් පරිසරයේ නැතිනම් ස්වභාවයේ-දර්ශනය කරා පැමිණීම නිසාය.හේගල්ගේ ස්වාභාවය පිළිබඳ දර්ශනයට ලුඩ්විග් ෆියුබාගේ විරුද්ධත්වය මාක්ස් ඇගයූමුත් සහ එමෙන්ම හේගල්ට එරෙහිව ෆියුබාගේ ප්‍රතික්‍රියාවේ සාධනීය විචාරාත්මක පුලිඟු කිහිපයක් දිදුලූ බව මාක්ස් පිළිගත් මුත්, ෆියුබාගෙන් ඔබ්බට යමින් මාක්ස් අවධාරණය කළේ ස්වාභාවය නිවැරදිව තේරුම් ගැනීමට නම් ස්වයං-සංවේදී ප්‍රතිභාව පෙරමුණට ගැනීම පමණක් නොව ඒ සමඟම එහි සංයුතිය සඳහා උපකාරි වන ඥාණ ක්‍රියාවලිය තුළට සමස්ථ මිනිස් භාවිතයම ඇතුළත් කර ගතයුතු බවය. මාක්ස්ට පූර්වයෙන් සහ පසුව සමාජගතවුණු දර්ශනයන්ට වඩා මාක්ස්ගේ සුවිශේෂත්වය නම් ස්වභාවය පිළිබඳ දර්ශනයට මිනිසාගේ ඉන්ද්‍රීය අත්දැකීම් වල ඉතිහාසයද බද්ධ කර ගැනීමය. මාක්ස් තරයේ දැරූ අදහසක් නම් *'පරිසරයට ප්‍රමුඛත්වය දිය යුතුය'* යන්නය (මාක්ස් සහ එංගල්ස් 1848). හේගල් තම ස්වභාවය පිළිබඳ දර්ශනයේදී (ඉතිහාසය පිළිබඳ දර්ශනයේදී ඔහු සිතුවා මෙන් ම) සිතනු ලැබුවේ *'මවට උත්පත්තිය දෙනු ලබනුයේ පුතාය'* යන්න වැනි විලෝපනයකි (මාක්ස්:1844). එහෙත් *'පුතාට උත්පත්තිය දෙන මව නො සලකා පුතා පෙරට ගැනීම වැන්නක් තිබිය හැක්කේ ව්‍යවහිතභාවයක් තුළ පමණි.'* (උද්ධෘතය Schmidt 1973, පිටු. 26-27)

මාක්ස්ට අනුව මිනිසා සහ ස්වභාවය අතර ඒකත්වය ෆියුබා විසින් විස්තර කරනු ලැබුවේ *'ස්වභාවයෙන් මිනිසා පැන නැඟුනේය'* වැනි අද්භූත රූ පෙරළියක් කරමින් මිස ස්වභාවය සමඟ සමාජීය-ඓතිහාසික වශයෙන් සිදු වූ මිනිස් මැදිහත්වීම්වල ඒකත්වයේ (unity) ප්‍රතිඵලයක් ලෙස නො ගනිමිනි. ෆියුබාගේ මෙම ප්‍රධාන දුර්වලකම ඇතුලූ වෙනත් අඩුපාඩු ද නිසා මිනිසා පිළිබඳව ෆියුබා ගේ මානව විද්‍යාත්මක උද්දීපනය සැමවිටම වියුක්ත විය. ෆියුබා ස්වභාවය දුටුවේ 'ඓතිහාසික-සජාතීය පදාර්ථයක්' ලෙසය (historico-homogeneous category). මාක්ස්ගේ විචාරයේ හරය වූයේ මෙම සජාතීයභාවය පුද්ගලයා සහ වස්තුව අතර අපෝහයකට දියකර විසුරුවා හැරීමය. මාක්ස්

ස්වභාවය පිළිබඳ තමාගේ දර්ශනය ගොඩනැගීමේදී පරිසරය සහ මිනිසා අතර සම්බන්ධයේ අධිභෞතික විවරණයන් අභිබවා ගොස් කරන ලද විස්තර කිරීම් වලින් පමණක් නොව සද්භව ප්‍රතිපාදනයන්ගෙන්ද (ontological demonstrations) මාක්ස් දුරස්ථ වූයේ ඒවා දැඩ විචාරයන්ට භාජනය කරමිනි. ෆියුබා පිළිබඳව මාක්ස්ගේ විචාරය නිෂේධනාත්මක සහ ප්‍රතිජානාත්මක වූයේ මේ නිසාය.

ලුඩ්විග් ෆියුබා හැරුණු විට පරිසරය පිළිබඳ තේමාවේදී මාක්ස්ගේ ප්‍රතික්‍රියාවන් තවත් තිදෙනකු වෙත ද එල්ල විය. මානව මැදිහත්වීමකින් තොරව ස්වභාවයට එහි ශක්‍යතාවය තුළින්ම පැවැතිය (nature can exist in-itself) හැකිය යන අදහස දරමින් ස්වභාවය මිනිසාගෙන් වෙන් කළ ස්පිනෝසාගේ ස්ථාවරය මාක්ස් පිළිනොගත්තේ මිනිසා පහලවීමට පෙර තිබූ ස්වභාවය පිළිබඳ සංකල්පය කරා ස්පිනෝසා අපවරගෙන ගිය බැවිනැයි චෝදනා කරමිනි.

ස්වභාවය හෙවත් පරිසරය පිළිබඳ සංකල්ප දෙකක් දැකිය හැකිය; (අ) ස්වභාවයේ ප්‍රාග්-මානව අවධිය (pre-human concept of nature). (ආ) මානවයා සමඟ ස්වභාවය (post-human concept of nature). මිනිසුන් වන අපට වැදගත් වනුයේ “මිනිසා සහිත පරිසරයේ ස්වභාවය තේරුම් ගැනීම බව මාක්ස් විසින් අවධාරණය කරනු ලැබීය”. ඉතිහාසය පුරාම ස්වභාවය හොඳට මෙන්ම නරකට ද වෙනස් කරනු ලැබුවේ මිනිසා මුත් අද භයානක නරක විපාක ඇතිකරමින් මිනිසා සහ පරිසරය යන දෙවර්ගයම අර්බුදයට ඇද දමා ඇත්තේ ධනවාදී මිනිසාය. මාක්ස් විසින් කරනු ලැබුවේ මේ ධනවාදී මිනිසා ස්වභාවය විනාශ කරන ආකාරයත් මොහුගෙන් ජෛවගෝලය බේරා ගැනීමේ උපාය මාර්ගත් ඒ උපායමාර්ග සඳහා රැඩිකල් දේශපාලනයක අවශ්‍යතාවත් ඉස්මතු කර පෙන්වීමයි.

‘භූගර්භ විද්‍යාත්මක ‘හෙලෝසීන’ යුගයෙන් (Holocene Age) ‘මානවසීන’ යුගයකට (Anthropocene Age)[15], එනම්, මිනිසා නිසා (ධනපති මිනිසා නිසා) තීරණාත්මක ලෙස මානව වර්ගයාට අහිතකර වන පරිදි සමස්ථ ජෛව පද්ධතියම විපර්යාසයට භාජනය කිරීමේ යුගයකට අප මුහුණ දී සිටිමු’’. (මහාචාර්ය Crutzen:2006). ධනවාදී මිනිසාගේ මැදිහත්වීම නිසා ස්වභාවය අතිභයංකාර ලෙස අද වෙනස් වෙමින් පවතින අතර මේ ගමන නැවැත්විය හැක්කේ ද ‘මිනිසාගේ ප්‍රඥා-පූර්වක මැදිහත්වීම හරහා පමණි’ යන්න මාක්ස්ගේ ආස්ථානයයි. “ස්වාභාවික පරිසරයට මිනිසාගේ මැදිහත්වීම” යන මාක්ස්ගේ සංකල්පයෙහි අර්ථය මෙයයි.

අනික් අතට සහ දෙවනුව ජර්මන් විඥාණවාදීන් විසින් ස්වභාවය සමඟ පවත්වන සම්බන්ධයේදී විඥාණයේ ස්වතන්ත්‍රභාවය පිළිබඳව අවධාරණය කළ කාන්ට්, ෆිෂෙ සහ හේගල් වැන්නන් ද මාක්ස්ගේ විචාරයට ලක්විය. නිෂ්පාදන බලවේගයක් ලෙස මැදිහත් වනුයේ සංයුක්ත සජීවී ජීවත් වීමට ආශයක් ඇති සහ වෙනත් විකල්පයක් නො මැති භෞතික සහ සාංදෘෂ්ටිකවාදී මිනිසා මිස අභෞතික වියුක්ත මිනිසෙකු හෝ ප්‍රාණේද්‍රියක් (spirit) නොවේ. අනික් අතට සංයුක්ත ලෙස සහ ඓතිහාසිකව ස්ථාපිත වුණු පුද්ගලයාගේ සහ ස්වාභාවික පරිසරයේ ඒකත්වය, කේවලත්වය (absolute) යන සංකල්පයකින් විස්තර කිරීමට උත්සාහ කිරීමෙන් මිනිසා සහ පරිසරය අතරත්, මිනිසාගේ ස්වභාවය සහ පරිසරයේ ස්වභාවය අතරත් පැවති සහ පවතින ප්‍රකෘති සම්බන්ධය හේගල් විසින් ‘විකෘති සද්භවවාදී නිර්මිතයකට’ (unnatural ontological construction) පෙරළන ලදි. මාක්ස්ගේ ආස්ථානය, Alfred Schmidt ගේ ප්‍රකාශනයක දළ සිංහල පරිවර්තනයනින් මෙසේ දැක්විය හැකිය. “ස්වභාවය මිනිසාගෙන් වෙන් කළ නොහැක. මිනිසා සහ ඔහුගේ අධිෂ්ඨානයෙන් ප්‍රභවය ලබන කාර්ය සාධනයන් ස්වාභාවයෙන් වෙන් කළ නොහැකිය. චින්තනයට මිනිසා සතු කුසලතාවය සහ හැකියාව ස්වභාවයේ සහ ඉතිහාසයේ නිපැයුමකි. මාක්ස්ට අනුව ‘චින්තනයේ ක්‍රියාවලිය ලාක්ෂණික වනුයේ ස්වභාවයේ ක්‍රියාවලියක් හැටියටය’ (Schmidt: 1973).

15. *Anthropocene යනු මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් භූ ගර්භය සහ පරිසරය තුළ සිදුවන ජීවවිද්‍යාත්මක, රසායනික, සහ භූ ගර්භ ක්‍රියාවලීන් තීරණාත්මක විපර්යාසයන් සහිත, එනම්, පෘථිවිය කෙරෙහි මිනිසාගේ ආධිපත්‍යය පැතිරෙන අද යුගය හැඳින්වීමට පෝල් ක්‍රට්සන් සහ ඉයුජීන් ස්ටෝමර් විසින් 2000 වසරේදී හඳුන්වා දෙන ලද වදනකි. (බලන්න. International Geosphere-Biosphere Programme (IGBP) 2000. NewsLetter 41).*

මිනිසා යැපෙන්නේ ස්වභාවයෙනි. එනම් ස්වභාවය ඔහුගේ හෝ ඇයගේ ශරීරයයි. නොමැරී සිටින්නට නම් ඔහු ස්වභාවය සමග අවිච්චින්න සම්බන්ධයක් පැවැත්විය යුතුය. 'මිනිසාගේ ශාරීරික සහ මානසික ජීවිතය ස්වභාවයට බද්ධ වී ඇත', යන්නෙහි තේරුම මිනිසා ස්වභාවයට බද්ධ වී ඇත යන්නය. මාක්ස්ට වඩා කාවදින ලෙස ස්වභාවයේ සහ මිනිසාගේ ඒකත්වය මාක්ස්ගේ සගයාවූ එංගල්ස් විසින් ලියා තබා ඇත. "මසින් ලෙයින් සහ මොළයෙන් අප අයිති ස්වභාවයටය"(එංගල්ස්: :1940).

ධනවාදී කෘෂිකර්මයෙහි එකම අරමුණ ශ්‍රමිකයාව සූරාකන අතරතුර පස ද සොරකම් කිරීමය. ඕනෑම රටක් කාර්මික ආර්ථිකය හරහා වර්ධනය නිර්වචනය කරගන්නා විට පරිසර විනාශය වඩාත් ඉක්මන්වේ. (මාක්ස් එක් උදාහරණයක් ලෙස දක්වන්නේ ඇමරිකා එක්සත් ජනපදයයි). යුරෝපය පුරා ධනවාදය 18 සහ 19වෙනි ශත වර්ෂවල දී ව්‍යාප්ත වූයේ මිනිසා ඇතුළු ස්වාභාවික පරිසරය ඉවක් බවක් නොමැතිව කෙලෙසමිනි. "ධනවාදීන් මිනිසා ඇතුළු සමස්ථ පරිසරයම විනාශ කරමින් පරිසරය මුදල් බවට පරිවර්තනය කරනුයේ පස සහ ශ්‍රමය ඇතුලු මිනිසාට ස්වභාවයෙන් ලැබුනු සියලු සම්පතක්ම විනාශ කරමිනි" (මාක්ස් *Capital* 1). කැලෑවන්ගෙන් සහ තුරුලතාවන්ගෙන් අලංකරණයවූ වනාන්තරයන් විනාශ කිරීම තුළින් ධනවාදී සංස්කෘතියේ මානව විරෝධී ස්වභාවය පැහැදිලිව පෙනේ. "ධනවාදීන් ජෛව පද්ධතියෙන් විපුළ ප්‍රයෝජනයක් ගන්නා මුත් පෙරළා කැලෑවන් සංරක්ෂණය කිරීමට හෝ පසෙහි ජීව-සශ්‍රීකත්වය පස තුළ රඳවා ගැනීමට හෝ ඔවුන් කරනු ලබන කාර්යයක් නැත". (මාක්ස් *Capital* 2 ). ඔවුන් කරනු ලබන එකම කාර්යය පාංශු සාරයෙහි බිංදුවකුදු ඉතිරි නො කොට පස උළාකෑමයි. හෙක්ටයාර් ගණනින් ඔවුන් වෘක්ෂ රෝපණය කරනුයේ නම් එය කරනුයේ ද පරිසරයට ඇති ආදරයෙන් නොව වෘක්ෂයන් කවදා හෝ මුදල් වන බව ඔවුන් හොඳාකාරවම දන්නා හෙයිනි. ධනවාදීනට වෘක්ෂයන් වනාහී පරිසර සම්පතක් නොව හුවමාරු භාණ්ඩයක් පමණි.

හරිතවාදීන් මෙන් හෝ නො මේරූ ගෝලීය සහ ශ්‍රී ලාංකික පරිසරවාදීන් මෙන් ගහ-කොළ, සතා-සිව්පාවා පමණක් පරිසරය ලෙස මාක්ස් නො සැලකීය. මාක්ස්ගේ පරිසරය පිළිබඳ දර්ශනය තුළ පරිසරයෙහි උත්කෘෂ්ඨතම නිර්මාණයවූ මිනිසාට කේන්ද්‍රීය ස්ථානයක් හිමි වූයේ පරිසරය තමාට හිතකර පරිදි වෙනස් කර ගැනීමේ හැකියාව මිනිස් සතා (human animal) තුළ පමණක් ඇති බව ඔහු දුටු හෙයිනි (මාක්ස් *EPM 1844*). බැටකන සහ පීඩා විඳින මිනිසෙකු හෝ ගැහැණියක හැටියට පමණක් නොව ඔහුට / ඇයට ස්වභාවයෙන්ම උරුමවූ පිරිසිදු ජලය, පිරිසිදු වාතය සහ ආලෝකය අහිමි කොට මිනිසාගේ එකම ස්වාභාවික ශක්තිය වන ශ්‍රමය සූරා කෑමට පමණක් සිත එකලස් කරගත් ධනපතීන්ගෙන් මෙම ක්‍රමයෙන් තැලෙන පොඩි වෙන මිනිසා ගලවා ගැනීමේ උදාර පරමාර්ථය මාක්ස්ගේ දර්ශනයේ න්‍යෂ්ටියයි. පිරිසිදු වාතය, පිරිසිදු ජලය, ආලෝකය සහ ආරක්ෂාව කම්කරුවාට ලබාදීම ධනපතියාගේ න්‍යාය පත්‍රයේ එදා නො තිබුණ අතර අද ද නැත. ඒවා කම්කරුවාට සැපයීම ධනපතියාගේ කාර්යයක් ලෙස ඔවුහු නො සලකති. එහෙත් තමන්ගේ උරුමය තමන්ට ලබාගැනීම මිනිස්-කම්කරුවාගේ අයිතියයි. මෙයට හේතුව ස්වාභාවික සම්පත් අස්වාභාවිකව ධනපතියා තම දේපොළක් කර ගත්තද ස්වාභාවික සම්පත් ස්වාභාවිකවම නම් ධනපතියාගේ පෞද්ගලික දේපොළ නොවන හෙයිනි. ඒවා පොදු දේපොළය. ඒවා ස්වාභාවික වනුයේද මේ අර්ථයෙන් පමණි. මෙම දර්ශනය තුළ නිරන්තරයෙන්ම සිටි මාක්ස් ස්වභාවය සහ මිනිසා පිළිබඳ සිය දර්ශනය ඒකරාශී කරනු ලැබූ *EPM* 1844 කෘතියෙහි මෙසේ ලියා තැබීය.

*"...(ධනවාදියා) මිනිසා නැවත ගල් ගුහාවට ගෙන ගියා මෙනි. එහෙත් මෙම ගුහාව නැතිනම්... මෙම මෘතශරීරාගාරයට ගෙවීමට සිදුවනුයේ ද කම්කරුවාටමය. ආලෝකයේ ජීවත්වීම ඔහුට අහිමිය. තිරිසනුන් සතු සරල පිරිසිදුකම වුව ද ඔවුන්ට සැපයීම ධනපතියාගේ අවශ්‍යතාවයක් හෝ යුතුකමක්*

*16. ගෝලීය දේශපාලනයේ මානව විරෝධීභාවය පිළිබඳව නිරන්තරයෙන් විචාරයක යෙදෙන ස්ලේවොජ් ජිජැක් ද 'පරිසර අර්බුදයෙන් මානව ජාති විශේෂය මුහුණ දෙන ගැටලුව විසඳිය හැක්කේ පළමුව ධනවාදී නිෂ්පාදන ප්‍රකාරය නැමැති ප්‍රධාන එමෙන් ම විශේෂ බාධකය විසඳා ගැනීම තුළින් පමණි'' යැයි අවධාරණය කිරීම තුළින් ජිජැක් ද මාක්ස්ගේ ස්ථාවරයට පැමිණ ඇති බව පෙනේ. (ස්ලවෝජ් ජිජැක් Living in the End Times 2011).*

*නොවේ"* (මාක්ස් *EPM 1844)*. කාල් මාක්ස්ට (සහ එංගල්ස්ට) අනුව නූතන ලෝකයේ පරිසර විනාශයේ සහ පරිසර දූෂණයේ ප්‍රධාන වගඋත්තරකරුවා වනුයේ ධනවාදයයි. ධනවාදී නිෂ්පාදන ප්‍රකාරයයි[16]. පරිසර විනාශය වැළැක්විය හැක්කේ සමාජවාදී ව්‍යාපෘතියකට පමණි. එනම් පරිසරය සහ මිනිසා යන ද්වයම මෙම පරිසර දඩයක්කාරයන්ගෙන් බේරා ගැනීමෙන් පමණි. මෙම අරමුණ සාක්ෂාත් කර ගත හැක්කේ මිනිසා සහ ස්වාභාවය දෙකක් නොව එකක් ලෙස සලකන සහ එමෙන්ම 'පරිසර සංරක්ෂණය යනු පොදුවේ මිනිසාගේ ද සංරක්ෂණයේ එකම සහතිකය' බව අවධාරණය කරන සමාජවාදී ව්‍යාපෘතියකට පමණි. මාක්ස් දියත් කළේ එම ව්‍යාපෘතියයි. පරිසර අර්බුදයෙන් මානව සංහතිය බේරා ගත හැක්කේ එවිට සහ එවිට ම පමණි. ධනවාදී 'පරිසර දඩයක්කාර-ව්‍යාපෘතීන්ගෙන්' සහ 'පරිසර නාශක අවස්ථාවාදී දේශපාලන පළිබෝධකයින්ගෙන් ' පරිසරය බේරාගැනීම හුදු හරිත ව්‍යාපාරයක් නොව රක්ත දේශපාලන වැඩපිළිවෙලක් විය යුත්තේ මේ නිසාය. අනාගත පරම්පරාවට පරිසරය රැකදීම සැබෑ අවශ්‍යතාවය ලෙස සලකන්නේ නම් කාලය, මුදල් සහ ශ්‍රමය නාස්ති කරනු ලබන ඉහත උදාහරණ ලෙස දැක්වූ යෝජිත නිශ්ඵල ව්‍යාපෘතීන් භාවිතයෙන් (practice) වහාම ඉවත්වී පරිසර අර්බුදය විසඳීම සඳහා ශක්‍යතාවයක් ඇති දේශපාලන න්‍යායකින් (theory) භාවිතය සන්නද්ධ කළ යුතුය. පරිසර අර්බුදය අද උග්‍රතම අර්බුදය වී ඇති අති විශේෂ තත්ත්වය තුළ භාවිතය අයාලේ යැවීම හෝ භාවිතය දඩාවතේ හැරීම හෝ අපට කළ නොහැකිය. හේතුව එය අපට දැරිය නො හැකි හෙයිනි. භාවිතය (practice) සුභාවිතයක් (praxis) වනුයේ එය න්‍යායකින් (theory) සන්නද්ධ කිරීමෙන් පමණි. පරිසර ගැටලුව සඳහා ගැඹුරු න්‍යායක් සහිත දර්ශනයක් කාල් මාක්ස් සිය *EPM* සහ වෙනත් කෘතීන් තුළින් ඉදිරිපත් කළේ මේ සත්‍යය පැහැදිලි කිරීමටය.

*"න්‍යායෙන් තොර භාවිතය හුදු ශ්‍රම වැගිරීමක් වන අතර භාවිතයෙන් තොර න්‍යාය වඳය, නිශ්ඵලය "*

*"Practice without theory is blind; theory without practice is sterile"*

*වී.අයි. ලෙනින්.*

***Bibliography***


Benton, T. (1989). 'Marxism and Natural Limits: An Ecological Critique'. *New Left Review , 178.*

Boliot, A. (1952). 'The Anti-Humanism of Marxist Philosophy'. *The Philosophy of Communism.* New York

Broughton, E. (2005, 4:6). 'The Bhopal Disaster and Its Aftermath: A Review'. *A Global Access Science Source* 2005**,** 4:6

Burkett, P. (1999). *Marx and Nature: A Red and Green Perspective*. New York: St. Martin's Press. Chandrashekhar, V. (2010, 07 06). *Bhopal Gas Trial convicts eight in India, but disappoints activists*. Retrieved 09 10, 2013 from *Christian Science Monitor*: http://www.minnpost.com/christian-science-monitor/2010/06/bhopal-gas-trial-convicts-eight-india-disappoints-activists

Collins (2006) *Collins Dictionary*. Glasgow. Harper Collins

De Silva, T. (2006). *The Black Box of Bhopal: A Closer Look at the World's Deadliest Industrial Disaster.* Trafford Publishing. U.S.A

Dibley.B. (2012) 'Nature is Us' The Anthropocene and Species-Being'

Eckerman, I (2005). *The Bhopal Saga—Causes and Consequences of the World's Largest Industrial Disaster*. India: Universities Press.

Engels, F. (1844). *The Condition of the Working-Class in England.* London.

Foster .J. B (2013) 'Toward a Global Dialogue on Ecology and Marxism' *Monthly Review* N.Y. City

Foster J.B. (2000) *Marx's Ecology: Materialism & Nature*. New York. Monthly Review Press

Foster, J. B. (2000). 'Marx's Ecology: Materialism and Nature'. *Monthly Review* . N.Y City

Foster. J. B. (2007, 11 28). 'Marx and the Global Environmental Rift'. In *Monthly Review*. N.Y. City

Foster. J.B. (1999) 'Marx's Theory of Metabolic Rift' *American Journal of Sociology* . Vol. 105. NO.2

Foster. J.B. (1999) 'Marx's Theory of Metabolic Rift ' American Journal of Sociology. Vol. 105. NO.2

Gamlath.S. (2008) *English- Sinhala Shabdha Koshaya* Sanhinda. Nugegoda

Giddens, A. (1981). *A Contemporary Critique of Historical Materialism.* Berkeley Uiversity: California Press.

Grundmann, R. (1991). *Marxism and Ecology* . Oxford University Press. Oxford

International Geo-sphere-Biosphere Programme (IGBP). *News Letter* 41.

J. D.Saches . (2008) *Common Wealth: Economics for a Crowded Planet* Penguin

Jayathileke De.Silva (2009) *Capital 1&2.* 21st Century Publishers Kottawa, Pannipitiya

Kolakowsky. (1978) *Main Current of Marxism* Oxford. Oxford Universty Press

*Lanka (*2013). February. 10

Liebig J.Von ( 1840/1862) *Organic Chemistry in its Application to Agriculture and Physiology),* Edited from the Manuscript of the Author by Lyon Playfair.

Malalasekere.G. (2007) *Sinhala Shabdha Koshaya* Gunasena. Colombo

Mallikarachchi.Desmond (2003-2010) *Marxist Essays* in Sinhala), Sanhinda. Nugegoda.

Mallikarachchi.Desmond (2010) *Karl Marx* (Sinhala Tran). Of the book *Karl Marx* by Prof. Terry Eagleton (1997)

Mallikarachchi.Desmond 2011 'Tribute to Karl Marx' *Island* (Midweek)

Mallikarachchi.Desmond. (2008) 'Lyrical Poet in Marx' *The Times* October 15

Marx, Karl (1976) *Capital* . Vol. 1 New York, Penguin

Marx, Karl (1981) *Capital*. Vol. 3 New York Penguin

Marx, Karl (1959) *Economic and Philosophical Manuscripts of 1844.* Progress Publishers Moscow

Miller. A.V. (1970) *Hegel's Philosophy of Nature* Oxford UP Oxford

Moore, J. W. (2000). 'Environmental Crises and the Metabolic Rift in World-Historical Perspective'. *Organization & Environment,* 123-157.

*Parisara Puwath* series Published by Central Environmental Authority of Sri Lanka.

Prawer.S.S. (1976) *Karl Marx and World Literature*. Oxford. Oxford University Press

Schmidt, A. (1973). T*he Concept of Nature in Marx.* Verso.

Sikorsky. Wade (1993) *Modernity & Technology*. Tuscaloosa. University of Alabama Press.

Siva, Vandana ^2008& *Soil Not Oil*. South End Press

Tucker, R. C. (1961). *Philosophy and Myth in Karl Marx* . Cambridge University Press. U.K.

Wijethunga .H. ^2005& *Sinhala Shabdha Koshaya* Gunasena. Colombo

Zizek.S. (2011) *Living in the End Times* Verso

Zizek.S. 'Censorship Today: Violence or Ecology as a New Opium for the Masses' Part 1.

# Waste Management in Sri Lanka:Effective Approaches

*G. Kumanayake*

*He has a BA from the University of Colombo. He served at the Marga Institute as a Research Officer and joined Parliament in 1993. At present he is the Chief Research Officer.*

**Introduction**

Waste management is very important in protecting the environment. Waste generated by human activities cause environmental pollution. With rapid urbanization, this has become a major problem. The waste can be categorised as 'liquid waste' and 'solid waste' depending on its physical state. In addition, substances that are harmful such as acid and chemicals are known as 'hazardous waste'.

In this paper emphasis is placed on Municipal Solid Waste (MSW) management. Solid waste has become a worldwide problem. In 2006 the total amount of Municipal Solid Waste generated globally reached 2.06 billion tones, representing a 7% annual increase since 2003. Especially in the third world countries huge stinking garbage dumps are not uncommon as a result of inefficient solid waste management systems. Uncollected waste contributes to environmental pollution, flooding and public health issues such as respiratory troubles, diarrhea and dengue fever.

The World Bank estimates the total amount of garbage generated by urban residents around the world will surge to 2.2 billion tons a year in 2025. That is about 2.6 pounds per person per day now.

The annual cost of managing all that trash will nearly double to US$ 375 billion, from US$ 205 billion, with low -income countries seeing more than five-fold increase.

The World Bank calls the problem a "looming crisis" as cities grow. It is described as a "silent problem" that is growing daily.

Waste management has three components, namely, minimization of waste generation, waste treatment and disposal.

**Situation in Sri Lanka**

Over the years many attempts have been made to find a solution to the garbage problem. However, still the problem persists and the cities and towns are unattractive with stinking garbage dumps.

In the Western Province, 700 tons of garbage is collected daily. The Colombo Municipal Council is entrusted with the task of keeping the city clean which is a huge responsibility.

The solid waste disposal problem has aggravated in Colombo and suburbs over the years. For instance, dumping garbage at Meethotamulla has become a major environmental issue. The people who live in the area bitterly oppose dumping garbage claiming that diseases such as dengue spread and their children are especially vulnerable. Sadly, a school- Sri Rahula Vidyalaya- was forced to close due to the garbage mount which is situated behind the school.

There are problems at Karadiyana too. Residents filed a court case against the dump yard. However, the Supreme Court rejected their plea. The paddy field was given to the Western Provincial Council by the Government in 2010 as there were no other suitable places.

A comprehensive policy framework is needed at the national and local level to link public health, environmental and economic instrument policies to the needs of the solid waste sector. In order to find a solution they have to work together and assist each other.

**The Legal Position**

Sri Lanka's laws pertaining to the waste management have a long history. According to the Section 99 of the Police Ordinance No.16 of 1865, failing to keep one's environment was an offence. It says: " No filth, or dirt, or dead or disabled animal shall be cast or allowed to remain in any street, road, canal, or other thoroughfare within any such town and limits, and every inhabitant within any such town and limits shall keep the space and street or road, and all surface drains, ditches, and gutters before his house clean, and the owners or occupiers of all private avenues, passages, yards, and ways, and all slaughter houses shall keep the same clean and shall remove the offal to such place as the

principal police officer or the division may point out under the directions of the Superintendent of police officer, and any person willfully offending against this section shall be guilty of an offence, and liable to any fine not exceeding twenty rupees."

In the recent past, several important regulations had been passed by Parliament. For example, Gazette No. 1466/5 of 10th October 2006 prohibited the manufacture, sale or use of polythene of 20 microns or below thickness. Gazette No. 1534/18 of 01 February 2008 deals with waste management. It is prohibited to discharge waste into environment. No person shall generate, collect, transport, store, recover, recycle or dispose waste or establish any site for disposal of any waste except under the authority of a license issued by the Central Environmental Authority.

**Local Government Authorities**

Waste management is primarily a task of local government authorities. Their inefficiency contributes in a massive way to the unsolved problem. The collection and disposal of solid waste in many local government areas are very unsatisfactory. Some local government institutions have hired private contractors but still the services are poor mainly due to lack of supervision. Furthermore, in selecting private contractors corruption is involved and many allegations are leveled against City Fathers which are never probed since members of all parties are allegedly involved.

Currently, many local government authorities lack vision or direction. With regard to waste management various ad hoc methods are being used. The streets, market places and bus stations are polluted with garbage. In many local councils, instead of tackling with burning issues, the members are involved in petty infightings. Furthermore, some Council members are engaged in crimes and other anti social activities. As a result, services of the institutions are greatly hampered.

As far back as in 2003 the Central Environmental Authority (CEA) had launched a Solid Waste Management Programme, under which it was to issue site clearance certificates for the dumping of solid waste. However, still solid waste is dumped haphazardly by many local garbage into Muthurajawela thereby causing severe environmental and health problems.

**Obstacles**

Apart from the inefficiency of the local government institutions, lack of strategies at the central government level, inadequate funds, unplanned urbanization and non-use of modern technology hamper the waste management in Sri Lanka.

***Poverty***

Poverty in urban areas is a great hindrance. If we take the city of

Colombo, poverty is widespread. In 1998 a government survey was conducted and it was revealed that 51 per cent of people in Colombo live in low-income settlements. The services are poor in the areas which have slums and shanties. Collection of waste matters and street sweeping are not methodical. In some areas rubbish bins are kept but people very often throw garbage into canals, wetlands or streets.

The current population of the city of Colombo is around 500,000. According to official statistics, 66,022 families live in 1,506 shanties and slums. According to statistics, some 1,000 acres of state land and other reserves are being occupied by slum dwellers. They are considered as illegal occupiers of unauthorized structures. Out of the estimated 1,000 acres, 71% have been taken over by those living in shanties and huts. Some of the occupants are not registered as voters even.

Colombo has some 63 slums areas which reflect a massive housing problem. Slums came into existence with the expansion of export trade. Urbanization is an integral part of development. The character of Colombo changed in keeping with the new economic demands for warehousing, workers' housing etc. Colombo became more congested and the Central, Northern and Eastern parts became characterized by predominantly low-income residential areas. Grand Pass, Kosgas Junction, Jinthupitiya, Armour Street, Bodhirajapura, Samagipura and Stacepura are thickly populated shanty areas.

Although the current city beautification programmes, especially the Metro Colombo Urban Development Projects are commendable, until and unless the 'shanty problem' is solved the city of Colombo cannot be modernized as a clean city.

### *Shortage of Trucks*

Many local government institutes find it difficult to provide trucks for collection of garbage. Supplying fuel too is a problem. Trucks are subject to frequent breakdowns due to the daily use. Moreover, they are not maintained properly.

### *Economic Liberalism*

The domestic market is flooded with cheap imported items. Therefore, micro-entrepreneurial activities such as plastic recycling and compost production are hampered.

### *Poor Technology*

The modern technology is not sufficiently used. New technology could reduce the amount of waste and ensure its effective disposal. Moreover, comprehensive training programmes are needed for the personnel who operate recycling plants.

*Collectors*

Collectors are exposed to injuries and diseases as many of them do not use protective gear such as gloves and boots. They are prone to accidents while performing their duties.

*Land*

Finding suitable land for waste disposal is a serious problem. Valuable wetlands such as Muthurajawela, Bolgoda and Attidiya with rich biodiversity are severely affected.

**Foreign experience**

It is pertinent to examine the methods of solid waste management in some foreign countries. Due to effective methods they have been able to achieve impressive results.

*The USA*

In 2010, Americans generated about 250 million tons of trash and recycled and composted over 85 million tons of this material, equivalent to a 34.1 per cent recycling rate. On average, the Americans recycled and composed 1.51 pounds of their individual waste generation of 4.43 pounds per person per day.

The Environmental Protection Agency (EPA) encourages practices that reduce the amount of waste needing to be disposed of, such as waste prevention, recycling, and composting. Organic materials continue to be the largest components of Municipal Solid Waste. Paper and paperboard, yard trimmings, food scraps, plastics, metals, rubber, leather, wood and glass make up the balance.
Landfills are engineered areas where waste is placed into the land. Transfer Stations are facilities where municipal solid waste is unloaded from collection vehicles and briefly held while it is reloaded onto larger, long-distance transport vehicles for shipment to landfills or other treatment or disposal facilities.

Recycling and composting prevented 85.1 million tons of material away from being disposed of 2010, up from 15 million tons in 1980. This prevented the release of approximately 186 million metric tons of carbon dioxide equivalent to taking 36 million cars off the road for a year.

Here, the situation in the city of Los Angeles with a population of 3,857,799 (2012 estimate) is briefly examined. Los Angeles disposes of about 3,400 tons of refuse per day in different landfills. In 1990 5,500 tons were disposed and a marked decline can be seen. Some landfills had been closed during the past few decades. For example, Branford Sun Valley in 1961, San Pedro in 1963, Griffith Park in 1985 and Lake View Terrace in 1996 had been closed.

Active landfills in Los Angeles County receive approximately 20,000 tons of non-hazardous solid waste each day. About 80% or approximately 16,000 tons per day is

disposed of and the remainder is reused or recycled. This represents about half of the total solid waste disposed of by the residents and businesses of the L.A. County. The Puente Hills Landfill is the largest landfill in the United States. There are 14 active landfills and recycling centers in Los Angeles.

Some of the facilities produce power seven days a week, 24 hours per day. For example, an average of 100 trucks per day deliver loads of solid waste to the Commerce Refuse-to-Energy Facility and the Facility burns an average of 360 tons of trash per day and generated a net ten megawatts of electricity for sale to the Southern California Edison Company. This is enough electricity for 20,000 homes.

The largest gas-to-energy facility is located at the Puente Hills Landfill. It produces approximately 50 megawatts of power, which would meet the energy requirements of approximately 100,000 homes. The energy output is sold to Edison International company. By 1947, there were more than 300,000 backyard trash incinerators throughout Los Angeles County. It was the primary means of waste disposal for many homes. However, they were identified as significant contributors to the problem of air pollution. The homeowners fiercely opposed efforts to ban backyard incinerators. They said that the real air polluters were the oil refineries and accused the authorities for doing very little to curtail these. Nevertheless, residential trash collection operations commenced and by 1958, backyard incinerators were completely banned. Some of the landfill and recycling facilities are operated by the private sector and some are by the County Sanitation authorities.

California reduced the amount of trash send to landfills to a record low in 2012. State residents and businesses together discarded an average of 4.3 pounds of garbage per day, which is down from 4.4 pounds per person in 2011. By comparison, the state used to dump more than 8 pounds per person a day in 1989. The average is calculated by dividing the state's total trash disposal, 29.3 million tons in 2012, by the state's population of 37.7 million. California's Integrated Waste Management Act came into effect in 1989. Curbside recycling programmes and less consumption are being credited with the decline.

***Japan***

The country is moving towards 'Zero Waste'. There is a smaller amount of waste being generated in the first place. The focus is on building partnerships so that municipal authorities can have greater capacity, through integrated waste management turning waste into resources.

Households in Tokyo have to put their waste out in translucent bags segregated into three types: bulky wastes, packaging and paper, combustible and non-combustible, at a

place shared by 10-20 households. In addition, citizen groups collect paper for recycling and local fund raising, and because Japan's definition of waste is different to many other places, calculating the reclamation rate for Municipal Solid Waste becomes more difficult. Japan's definition of waste is "discarded materials which cannot be sold to other people". Therefore, the statistics for Japan often look different to solid waste statistics in other countries.

In 2008 for Japan as a whole, with a population of 127 million, there were 2.34 million tones of recyclables collected by municipalities, 4.51 million reclaimed by intermediate treatment and 2.93 million collected by citizens' groups, totaling 9.78 million tones or 20.3% of Japan's Municipal Solid Waste.

Nearly all of Tokyo's waste goes through some form of intermediate treatment in order to ensure that wastes are sent in the most appropriate direction: recycling, energy recovery or landfill. Therefore the amount of waste sent to landfill is decreasing dramatically.

**Switzerland**

Switzerland has a successful waste management policy. The principles for best managing waste to ensure a low impact on health and the environment have long been recognized. The European Union has set out four 'R's, namely, reduce, reuse, recycle and recover. Switzerland, although not a member of the EU, is considered a model in waste disposal. More than five million tons of urban refuse was produced in the country in 2006, of which around half was recycled. Most of the rest was incinerated.

The more than 50 per cent recycling rate makes the country among the greenest in Europe. For some materials, such as glass, the rate rises to 95%.

The waste management is entrusted with the Waste and Raw Materials section of the Federal Environment Office. To encourage recycling, special rubbish bags have been introduced to local communities. Rubbish bags carry a sign, a sticker or printed on the bag. Recycling is generally free.

According to the government statistics, 3.65 million tons of refuse went through the country's 29 incineration plants in 2006, of which 417,000 tons came from neighbouring countries. Incinerators had produced around 3.1 per cent of electricity in Switzerland in 2006. Only a small part of the waste ends up in landfill sites. It has been prohibited since 2000 to throw combustible or chemically unstable materials into landfill sites. Only the remains of combusted waste, some building materials and industrial waste are still going into rubbish dumps. Here Switzerland leads the way. In many countries, the use of such sites is much higher – in Italy it is 63%, Greece 91%, and the UK 78%.

*Hong Kong*

Hong Kong which is an autonomous region of China generates several types of solid waste. It includes Municipal Solid Waste (MSW), commercial and industrial waste, construction waste, chemical waste and livestock waste.

Each year, more than 6 million tons of MSW are generated, over half of which is disposed of the three strategic landfills. The generation of MSW has been growing at a much faster rate than expected, and the consumption-led lifestyle in Hong Kong is putting enormous pressure on the landfills. The three existing landfills cannot absorb the huge quantity of garbage. If the waste loads continue to increase, there will be a need to allocate an additional 400 hectares of land to develop new landfill sites to meet the waste disposal needs up to 2030. Being a geographically small area, Hong Kong faces practical problems. Therefore, Hong Kong needs a more sustainable way to deal with waste.

The Government has published "A Policy Framework for the Management of MSW- 2005-2014" in 2005. It sets out a comprehensive strategy for the management of MSW in the future. It consists of a series of policy tools and measures to tackle the waste problem head on.

